## පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය

# ඇගයීම් වාර්තාව
# 2021

## 03
## ත්‍රිපිටක ධර්මය

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි.

# පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය-2021

# ඇගයීම් වාර්තාව

# **03** - ත්‍රිපිටක ධර්මය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව පිරිවෙන් සාමාන්‍ය පෙළ විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

පෙරදී මූලික පිරිවෙන් අවසාන විභාගය ලෙස හැඳින්වූ මෙය 2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස නාම සංශෝධනය වූ අතර මෙම විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක අධ්‍යාපන ලැබීමට හැකි මගක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමින් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවෙණාචාර්යවරු ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2021 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවෙණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා පහක් යටතේ ගොනු කර ඇත.

පිරිවෙන් සාමාන්‍ය පෙළ සංස්කෘත විෂයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මක ව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය, I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු ලබාදීමේ පටිපාටිය, I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේ ද I ප්‍රශ්න පත්‍රයට අදාළ ව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයට ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ , නිගමන හා යෝජනා ද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන් ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්නපත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතරවන හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කර ගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය ( Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය(Item Response Theory) යොදාගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රියව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2024.07.31

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාව පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි සනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවී යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සම්ප්‍රදායක හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

2018 වර්ෂයයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස හැඳින් වූ පළමු වතාවට වර්ෂ 1981දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227ක් විභාගය සමත් විය.

පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගයේ දී අපේක්ෂකයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් දෙකක්වත් තෝරා ගත යුතුය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතු ය. එසේ නොවී විෂයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතුය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරින්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා බිහි කරන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ඩී. ඩී. වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග |
| විෂය සම්බන්ධීකරණය | : | ඩබ්.එස්.ඩී වීරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| සංස්කරණය | : | පූජ්‍ය අමුණුපුරේ සීලවංශ හිමි<br>ගුරු අධ්‍යාපනඥ සේවය I<br>විශ්‍රාමික පීඨාධිපති |
| | : | පූජ්‍ය රත්මල්විට චන්දානන්ද හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ලේඛක මණ්ඩලය | : | පූජ්‍ය අමුණුපුරේ සීලවංශ හිමි<br>ගුරු අධ්‍යාපනඥ සේවය I<br>විශ්‍රාමික පීඨාධිපති |
| | : | පූජ්‍ය රත්මල්විට චන්දානන්ද හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| | : | පී. ඒ. සරත් කුමාර මයා<br>පරිවේණාචාර්ය<br>ගුරු සේවය I |
| පරිගණක පිටපත සැකසුම | : | ඩී. ඒ. අයේෂා මධුවන්ති<br>දත්ත සටහන් සහකාර |
| පිටකවරය නිර්මාණය | : | ඒ. කේ. එල්. චතුරාණි<br>කළමනාකරණ සේවා නිලධාරී |

# පටුන


| | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | i |
| පෙරවදන | ii |
| පටුන | iv |
| වගු නාමාවලිය හා ප්‍රස්තාර නාමාවලිය | v |
| 1. ත්‍රිපිටක ධර්මය විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු | 01 |
| 1.1. ත්‍රිපිටක ධර්මය විෂයය අධ්‍යයනයේ අරමුණු | 01 |
| 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු | 02 |
| **I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය** | 05 |
| **2.** **I** ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු | 06 |
| 2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය | 06 |
| 2.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න 1 සිට 40 දක්වා) | 07 |
| 2.3 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය | 12 |
| 2.4 තේමා අනුව I ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රශ්න ඉදිරිපත් කර ඇති අකාරය හා විශ්ලේෂණය | 14 |
| 2.5 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජන | 17 |
| **II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය** | 19 |
| **3.** **II** ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු | **20** |
| 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය | 20 |
| 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය | 21 |
| 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය | 22 |
| 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය | 23 |
| 3.5 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය | 24 |
| 3.6 II ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා | 41 |
| **4. පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු** | 43 |
| **5. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා** | 44 |

## වගු නාමාවලිය | පිටු අංකය


| | | |
|---|---|---|
| වගුව 1.1 | විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව | 02 |
| වගුව 1.2 | අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය | 02 |
| වගුව 1.3 | පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව | 03 |
| වගුව 1.4 | ලකුණු ලබාගෙන ඇති ආකාරය පන්ති ප්‍රාන්තර අනුව | 04 |
| වගුව 2.1 | I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය | 11 |
| වගුව 2.2 | I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය | 13 |
| වගුව 2.3 | තේමාව හා ඊට අදාළ ප්‍රශ්න අංක | 14 |
| වගුව 2.4 | තේමාව අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය සහ ඒවායේ පහසුතාව | 14 |
| වගුව 3.1 | පළමු වැනි අනිවාර්ය ප්‍රශ්නයෙහි කොටස්වලට අදාළ විෂය | 26 |


## ප්‍රස්තාර නාමාවලිය | පිටු අංකය


| | | |
|---|---|---|
| ප්‍රස්තාරය 2.1 | I පත්‍රයේ ප්‍රශ්නවල පහසුතා දර්ශකය | 12 |
| ප්‍රස්තාරය 2.2 | I පත්‍රයේ තේමා අනුව එක් අයිතමහෙයි පහසුතා දර්ශකය | 15 |
| ප්‍රස්තාරය 2.3 | I පත්‍රයේ තේමා අනුව හා පහසුතාව ඉදිරිපත් ඇති ප්‍රශ්න ප්‍රතිශතය | 16 |
| ප්‍රස්තාරය 3.1 | II පත්‍රය - ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 21 |
| ප්‍රස්තාරය 3.2 | II පත්‍රය - ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 22 |
| ප්‍රස්තාරය 3.3 | II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයේ කොටස්වල/අනු කොටස්වල පහසුතා දර්ශක | 23 |
| ප්‍රස්තාරය 3.4(a) | 1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 25 |
| ප්‍රස්තාරය 3.4(b) | 1 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් වල පහසුතාව | 26 |
| ප්‍රස්තාරය 3.5(a) | 2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 29 |
| ප්‍රස්තාරය 3.5(b) | 2 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් වල පහසුතාව | 29 |
| ප්‍රස්තාරය 3.6(a) | 3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 31 |
| ප්‍රස්තාරය 3.6(b) | 3 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් වල පහසුතාව | 31 |
| ප්‍රස්තාරය 3.7(a) | 4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 33 |
| ප්‍රස්තාරය 3.7(b) | 4 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් වල පහසුතාව | 33 |
| ප්‍රස්තාරය 3.8(a) | 5 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 35 |
| ප්‍රස්තාරය 3.8(b) | 5 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් වල පහසුතාව | 35 |
| ප්‍රස්තාරය 3.9(a) | 6 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 37 |
| ප්‍රස්තාරය 3.9(b) | 6 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් වල පහසුතාව | 37 |
| ප්‍රස්තාරය 3.10(a) | 7 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 39 |
| ප්‍රස්තාරය 3.10(b) | 7 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් වල පහසුතාව | 39 |
| ප්‍රස්තාරය 3.12 | II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ප්‍රතිශතය, ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන | 41 |

# 1. ත්‍රිපිටක ධර්මය විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1 ත්‍රිපිටක ධර්මය විෂයය අධ්‍යයනයේ අරමුණු

1. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවත් ව හා යථාර්ථවාදීව කටයුතු කරන, නිවැරදි ප්‍රායෝගික වතාවත්වල යෙදෙන භික්ෂු හා ගිහි පරපුරක් බිහි කිරීම.

2. ජීවන ගමනේ දී මුහුණපාන අභියෝග ජයගැනීමට හා නිවැරදි යහපත් ජීවන රටාවක් ගොඩනගා ගැනීමට බුදු දහමේ මූලික ඉගැන්වීම් උපයෝගීකොටගෙන සිව්වනක් පිරිසේ යහපත් ආදර්ශ ද එක්කොට ගත් දහැමි පරපුරකට මග පෙන්වීම.

3. නිවැරදි හා යහපත්, ආදර්ශවත්, යථාර්ථවාදී භික්ෂු ජීවිතයක් ගොඩනගා ගැනීමට භික්ෂු විනය හා ශික්ෂාපද ප්‍රගුණ කිරීමට මග පෙන්වීම.

4. බෞද්ධ ත්‍රිපිටකාගත සූත්‍ර අධ්‍යයනයකොට භික්ෂු ජීවිතය සාර්ථක කරගැනීමටත් ගිහි ජනතාවට මග පෙන්වීමටත් ඒ තුළින් සුපෞරුෂයක් ගොඩනගා ගැනීමටත් මග පෙන්වීම.

5. ධම්මපද ගාථා අධ්‍යයනය කොට ආදර්ශ සපයාගනිමින් භික්ෂු ජීවිතය සාර්ථක කර ගැනීමටත්, ගිහි ජීවිත සාර්ථක කර ගැනීමට ධර්ම දේශනා කිරීමටත් මග පෙන්වීම.

6. ශ්‍රී ලාංකේය හා බෞද්ධ සංස්කෘතික උරුමය හැඳින, ශාසනික උරුමය රැකගැනීමත්, ඒවා පවත්වා ගැනීමටත් අවශ්‍ය ආදර්ශ සපයන භික්ෂු හා ගිහි සිසු පිරිසක් බිහිකිරීම.

7. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

8. සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සංවර්ධනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කොටගෙන ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනගා ගැනීමටත්, ගිහි ජනතාවට මග පෙන්වීමටත් අවශ්‍ය ශක්තිය ලබාදීම.

ත්‍රිපිටක ධර්මය විෂය නිර්දේශය (2017)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2284 | 19 | 2303 |
| ඉංග්‍රීසි | 16 | 00 | 16 |
| එකතුව | **2300** | **19** | **2319** |

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 174 | 7.6 | 1 | 5.3 | 175 | 7.50 |
| B | 292 | 12.7 | 5 | 26.3 | 297 | 12.80 |
| C | 810 | 35.2 | 6 | 31.6 | 816 | 35.20 |
| S | 637 | 27.7 | 5 | 26.3 | 642 | 27.70 |
| W | 387 | 16.8 | 2 | 10.5 | 389 | 16.80 |
| එකතුව | **2300** | **100.00** | **19** | **100.00** | **2319** | **100.00** |

## වගුව 1.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමාර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන (B) සාමාර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමාර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 153 | 12 | 7.84 | 16 | 10.46 | 47 | 30.72 | 49 | 32.03 | 124 | 81.05 | 29 | 18.95 |
| ගම්පහ | 195 | 23 | 11.79 | 23 | 11.79 | 74 | 37.95 | 52 | 26.67 | 172 | 88.21 | 23 | 11.79 |
| කළුතර | 173 | 32 | 18.50 | 18 | 10.40 | 49 | 28.32 | 40 | 23.12 | 139 | 80.35 | 34 | 19.65 |
| මහනුවර | 239 | 19 | 7.95 | 57 | 23.85 | 91 | 38.08 | 55 | 23.01 | 222 | 92.89 | 17 | 7.11 |
| මාතලේ | 83 | 3 | 3.61 | 11 | 13.25 | 39 | 46.99 | 19 | 22.89 | 72 | 86.75 | 11 | 13.25 |
| නුවරඑළිය | 34 | 0 | 0.00 | 3 | 8.82 | 15 | 44.12 | 14 | 41.18 | 32 | 94.12 | 2 | 5.88 |
| ගාල්ල | 167 | 7 | 4.19 | 19 | 11.38 | 55 | 32.93 | 59 | 35.33 | 140 | 83.83 | 27 | 16.17 |
| මාතර | 180 | 15 | 8.33 | 32 | 17.78 | 72 | 40.00 | 52 | 28.89 | 171 | 95.00 | 9 | 5.00 |
| හම්බන්තොට | 128 | 15 | 11.72 | 27 | 21.09 | 47 | 36.72 | 20 | 15.63 | 109 | 85.16 | 19 | 14.84 |
| වවුනියාව | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 1 | | 0 | 0.00 |
| අම්පාර | 57 | 2 | 3.51 | 9 | 15.79 | 25 | 43.86 | 15 | 26.32 | 51 | 89.47 | 6 | 10.53 |
| ත්‍රිකුණාමලය | 13 | 0 | 0.00 | 0 | 0.00 | 4 | 30.77 | 8 | 61.54 | 12 | 92.31 | 1 | 7.69 |
| කුරුණෑගල | 219 | 17 | 7.76 | 25 | 11.42 | 62 | 28.31 | 61 | 27.85 | 165 | 75.34 | 54 | 24.66 |
| පුත්තලම | 52 | 0 | 0.00 | 3 | 5.77 | 28 | 53.85 | 12 | 23.08 | 43 | 82.69 | 9 | 17.31 |
| අනුරාධපුරය | 144 | 4 | 2.78 | 13 | 9.03 | 44 | 30.56 | 46 | 31.94 | 107 | 74.31 | 37 | 25.69 |
| පොළොන්නරුව | 58 | 0 | 0.00 | 1 | 1.72 | 15 | 25.86 | 18 | 31.03 | 34 | 58.62 | 24 | 41.38 |
| බදුල්ල | 110 | 4 | 3.64 | 9 | 8.18 | 32 | 29.09 | 37 | 33.64 | 82 | 74.55 | 28 | 25.45 |
| මොණරාගල | 71 | 3 | 4.23 | 4 | 5.63 | 28 | 39.44 | 22 | 30.99 | 57 | 80.28 | 14 | 19.72 |
| රත්නපුරය | 136 | 15 | 11.03 | 15 | 11.03 | 47 | 34.56 | 33 | 24.26 | 110 | 80.88 | 26 | 19.12 |
| කෑගල්ල | 106 | 4 | 3.77 | 12 | 11.32 | 42 | 39.62 | 29 | 27.36 | 87 | 82.08 | 19 | 17.92 |
| සමස්ත ප්‍රතිඵලය | 2,319 | 175 | 7.55 | 297 | 12.81 | 816 | 35.19 | 642 | 27.68 | 1,930 | 83.23 | 389 | 16.77 |

වගුව 1.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 9 | 0.39 | 2319 | 100.00 |
| 81 - 90 | 32 | 1.38 | 2310 | 99.61 |
| 71 - 80 | 110 | 4.74 | 2278 | 98.23 |
| 61 - 70 | 294 | 12.68 | 2168 | 93.49 |
| 51 - 60 | 443 | 19.10 | 1874 | 80.81 |
| 41 - 50 | 497 | 21.43 | 1431 | 61.71 |
| 31 - 40 | 479 | 20.66 | 934 | 40.28 |
| 21 - 30 | 319 | 13.76 | 455 | 19.62 |
| 11 - 20 | 125 | 5.39 | 136 | 5.86 |
| 01 - 10 | 11 | 0.47 | 11 | 0.47 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- 31 - 40 පන්ති ප්‍රාන්තරය සැලකීමේදී,
මෙම විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2319 අතුරෙන් 31- 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 479කි. එය ප්‍රතිශතයක් වශයෙන් 20.66%කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 934ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 40.28%කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**I පත්‍රය - කාලය : පැය 01යි.**

වරණ 4 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40**කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.
එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් මුළු ලකුණු **40**ක් හිමි වේ.

## 2.2 I ප්‍රශ්න පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. බුදුරජාණන් වහන්සේ හැඳින්වීම සඳහා 'මග්ගවිදූ, මග්ගකොවිද, මග්ගඤ්ඤූ' යන පද භාවිත කරයි. එසේ භාවිත කරන්නේ,
   (1) අතිවිශාල අනුගාමික පිරිසක් සිටි බැවිනි. (2) අධිපතියකු සේ කටයුතු කළ බැවිනි.
   (3) සියල්ලන්ට මාර්ගෝපදේශකයකු වූ බැවිනි. (4) ආචාරශීලී ඇවතුම් පැවතුම් ඇති බැවිනි.

2. බුදුරජාණන් වහන්සේගේ අසමසම දසබල ඤාණ අතුරින් සත්ත්වයන් සුගති දුගති භවයන්ට පැමිණෙන්නා වූ ද රහත් බව ආදී තත්ත්වයන්ට පැමිණෙන්නා වූ ද පිළිවෙත් සියලු ආකාරයෙන් දැනගත්තේ,
   (1) නානාධාතු පටිවෙධ ඤාණයෙනි. (2) සබ්බත්ථගාමිණි පටිපදා ඤාණයෙනි.
   (3) පුබ්බේ නිවාසානුස්සති ඤාණයෙනි. (4) නානාධිමුත්තික ඤාණයෙනි.

3. බුදුරජාණන් වහන්සේ මහාපුරුෂ ලක්ෂණ දෙතිසකින් යුතු වන සේක. ඉන් 'උස්සංඛ පාදො හොති' යන්නෙන් අදහස් වන්නේ,
   (1) දැල් කවුළු වැනි අත් පා ඇති බව ය. (2) ඔලු මුවන්ගේ බඳු කෙණ්ඩා ඇති බව ය.
   (3) දූවිලි නොරඳන සියුම් සම ඇති බව ය. (4) ඉහළින් පිහිටි ගොප් ඇටය සහිත පා ඇති බව ය.

4. අංගුලිමාල ආනන්තරිය පාපකර්මයක් සිදු කර අපාගත වන බව දුටු තථාගතයන් වහන්සේ ඔහුට පිහිට පිණිස වැඩම කළහ. එසේ ආනන්තරිය පාපකර්මයක් සිදු කර ගැනීමට සූදානම් වූයේ,
   (1) මිනිසුන් දහසක් මරා ඇඟිලි දහස සම්පූර්ණ කර ගැනීමෙනි.
   (2) සිය මෑණියන් මරණයට පත් කිරීමෙනි.
   (3) බුදුරදුන්ගේ සිරුරෙහි ලේ සෙළවීමෙනි.
   (4) කොසොල් රජු ඇතුළු පිරිවර මරා දැමීමෙනි.

5. ත්‍රිවිධ රත්නයේ උතුම් රත්නභාවයට හේතු වන කරුණු අතර 'අනොමසත්ත පරිභොගං' යන්නෙන් අර්ථවත් වන්නේ,
   (1) උසස් පුද්ගලයන් විසින් පරිහරණය කිරීමයි. (2) කලාතුරකින් දක්නට ලැබීමයි.
   (3) කිසිවකට සමාන නොවීමයි. (4) ඉතා අගනා බවයි.

6. ශ්‍රී සද්ධර්මයේ උතුම් ගුණ අතර 'ඕපනයික' ගුණයෙන් කියවෙන්නේ,
   (1) තමා විසින් ම අවබෝධ කරගත යුතු බව ය.
   (2) තමාට මෙලොවදීම අත්දැකිය හැකි බව ය.
   (3) මාර්ග ඵල ධර්ම ප්‍රත්‍යක්ෂ කිරීමෙන් නිර්වාණයට පමුණුවන බව ය.
   (4) එව බලව යැයි විවෘතව කිව හැකි බව ය.

7. ගෞතම සම්බුද්ධ ශාසනයේ ධම්මසේනාපති ලෙස ගරු බුහුමන් ලැබූයේ,
   (1) සැරියුත් මහරහතන් වහන්සේ ය. (2) මුගලන් මහරහතන් වහන්සේ ය.
   (3) ආනන්ද මහරහතන් වහන්සේ ය. (4) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ය.

8. දිනපතා පොහොය ගෙයි ඇමද පහන් දල්වා එම පහන් දැල්ල නිමිති වශයෙන් ගෙන තේජෝ කසිණය වඩා රහත් ඵලයට පත් වූයේ,

(1) ඛේමා තෙරණියයි.
(2) කිසාගෝතමී තෙරණියයි.
(3) උප්පලවණ්ණා තෙරණියයි.
(4) පටාචාරා තෙරණියයි.

9. බුද්ධඝෝෂ හිමියන් විසින් අටුවාකරණයේ දී භාවිත කළ ක්‍රමශිල්ප පිළිබඳ වැරදි ප්‍රකාශයකි,

19. මනා කොට තැන්පත් කර ගත යුතු සිව්මහා නිධානයන්හි ස්වභාව කියවෙන නිධිකණ්ඩ සූත්‍රයට අනුව 'අංගසම' නිධානය නම්,
   (1) තමන් සතු රන් රුවන් කෙත් වතු ආදියයි. (2) තමන් සතු අඹුදරුවන් හා දැසිදසුන් ආදියයි.
   (3) තමන් ඉගෙනගත් ශිල්ප ශාස්ත්‍ර ආදියයි. (4) තමන් සිදුකර ගත් පින්දහම් ආදියයි.

20. ධම්මපදයේ සහස්ස වග්ගයේ එන 'අභිවාදන සීලිස්ස' ගාථාව දේශනා කොට වදාළේ,
   (1) පටාචාරා තෙරණිය මුල්කොට ගෙන ය.
   (2) සංකිච්ච තෙරුන්ගේ සිදුවීම මුල්කොට ගෙන ය.
   (3) ආයුවඩ්ඪන කුමරුගේ සිදුවීම මුල්කොට ගෙන ය.
   (4) කිසාගෝතමියගේ සිදුවීම මුල්කොට ගෙන ය.

21. මා කළ පින සුළු ය. විපාක දෙන තරම් නොවේ යැයි අවමං නොකළ යුතු ය. දිය බිඳුව බැගින් වැටී කළයක් වුව ද පිරේ. ටිකෙන් ටික රැස් කරන පිනෙන් ප්‍රඥාවන්තයා පිනෙන් පිරී යන්නේ ය. යන අර්ථය කියවෙන ධම්මපද ගාථාවේ මුල් ගාථාර්ධයන් වන්නේ,
   (1) මාප්පමඤ්ඤේථ පුඤ්ඤස්ස - න මං තං ආගමිස්සති
   (2) භද්‍රොපි පස්සති පාපං - යාව භද්‍රං න පච්චති
   (3) පාණිම්හි චෙ වණොනාස්ස - හරෙය්‍ය පාණිනා විසං
   (4) වාණිජොව භයං මග්ගං - අප්පසත්ථො මහද්ධනො

22. "රජොවජල්ලං උක්කුටිකප්පධානං - සොධෙන්ති මච්චං අවිතිණ්ණ කංඛං" යන ගාථාර්ධයෙහි 'අවිතිණ්ණ කංඛං' යන්නෙහි අර්ථය වන්නේ,
   (1) කෝපය දුරු නොකළ යනුයි. (2) සැකය දුරු නොකළ යනුයි.
   (3) වෛරය දුරු නොකළ යනුයි. (4) ආශාව දුරු නොකළ යනුයි.

23. මිනිස් සිතෙහි ක්‍රියාත්මක වන කෙලෙස් ප්‍රහීණ වන ආකාර තුනකි. ඉන් සමුච්ඡේදප්පහාණ ලෙස සැලකෙන්නේ,
   (1) කෙලෙස් තාවකාලිකව දුරු කිරීමයි. (2) කෙලෙස් කලකට දුරු කිරීමයි.
   (3) කෙලෙස් මේ භවයට පමණක් දුරු කිරීමයි. (4) කෙලෙස් සම්පූර්ණයෙන් දුරු කිරීමයි.

24. අභිධර්මාර්ථ සංග්‍රහයේ 'රූප' ආකාර පහක් යටතේ විග්‍රහ කර ඇත. ඉන් රූප සමුට්ඨාන ලෙස සැලකෙන්නේ,
   (1) රූප පිළිබඳ සැකෙවින් විස්තර කිරීමයි. (2) දක්වන ලද රූප නැවත බෙදා දැක්වීමයි.
   (3) රූප උපදවන හේතු ප්‍රත්‍යය දැක්වීමයි. (4) රූප සමූහ වශයෙන් බැඳී සිටින ආකාරය දැක්වීමයි.

25. අභිධර්මයේ රූප විග්‍රහයට අනුව ආහාර රූපය (ඕජා) යනු කුමක් ද?
   (1) මනෝ සංචේතනාහාරය (2) විඤ්ඤාණාහාරය
   (3) ඵස්සාහාරය (4) කබලිංකාහාරය

26. පරිනිර්වාණය දෙ ආකාර ය. ඉන් සෝපධිසේස පරිනිර්වාණය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
   A - යමෙක් ජීවත්ව සිටිය දී ම සෝපධිසේස පරිනිර්වාණයට පත් වේ.
   B - සෝපධිසේස පරිනිර්වාණය ක්ලේශ පරිනිර්වාණය ලෙස ද හඳුන්වයි.
   C - පංචස්කන්ධයෙන් සදහටම මිදීමට පත්වේ.
   D - කුසල හෝ අකුසල කර්ම රැස් නොකරති.
   (1) A, B සහ D (2) A, B සහ C (3) A, C සහ D (4) B, C සහ D

27. දෙපණස් චෛතසික ධර්ම අතර සබ්බචිත්තසාධාරණ චෛතසික අයත් වන්නේ,
   (1) අකුසල රාශියට ය. (2) සෝභන රාශියට ය.
   (3) අන්‍යසමාන රාශියට ය. (4) කුසල රාශියට ය.

28. දෙවනපෑතිස් රජුගේ ඇරයුමෙන් අනුරාධපුරයට වැඩම වූ මිහිඳු මහරහතන් වහන්සේ රජ මැඳුරේ දී පළමුව දේශනා කරන ලද්දේ,
   (1) දේවදූත සූත්‍ර දේශනාවයි. (2) බාලපණ්ඩිත සූත්‍ර දේශනාවයි.
   (3) විමානවත්ථු පේතවත්ථු දේශනාවයි. (4) අග්ගික්ඛන්ධෝපම සූත්‍ර දේශනාවයි.

29. මහායාන බෞද්ධ සම්ප්‍රදායේ ඉගැන්වීම් පිළිබඳ නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණය වන්නේ,
   A - සම්බුද්ධත්වයෙන් පමණක් නිවන අවබෝධ කරගත හැකි බව ය.
   B - භක්ති මාර්ගය හා ඥාන මාර්ගය වැදගත් බව ය.
   C - බෝධිසත්වයන් වහන්සේ මහා කරුණාවෙන් යුතු බව ය.
   D - බුදුරජාණන් වහන්සේලා මිනිසුන් අතරම උපදින බව ය.

30. යෝගාවචරයා විසින් ධම්මානුපස්සනා සතිපට්ඨානයෙහි ස්කන්ධ විමර්ශනය සිදු කරන්නේ,
(1) නීවරණ පරිග්ගහයෙනි. (2) ඛන්ධ පරිග්ගහයෙනි.
(3) ආයතන පරිග්ගහයෙනි. (4) සච්ච පරිග්ගහයෙනි.

31. භාවනායෝගී යෝගාවචරයන් අතර දස අසුභ හා කායගතාසති කමටහන වඩාත් යෝග්‍ය වන්නේ,
(1) රාග චරිතය උදෙසා ය. (2) මෝහ චරිතය උදෙසා ය.
(3) සද්ධා චරිතය උදෙසා ය. (4) බුද්ධි චරිතය උදෙසා ය.

32. දුක පිළිබඳ පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අයත් අංග දොළස අතර 'උපාදාන' ලෙස හඳුන්වන්නේ,
(1) විඳීම් හේතුවෙන් ඇතිවන ඇලීමයි. (2) උපත ලැබීමට භවයන් ඇති වීමයි.
(3) දැඩිව අල්ලා ගැනීමයි. (4) ජරා මරණාදී දුකට පත්වීමයි.

33. විපාක දෙන කාල අනුව සතරාකාර කර්මයෙහි 'අපරාපරිය වේදනීය කර්මය' ලෙස හඳුන්වන්නේ,
(1) හැකි ඕනෑම අවස්ථාවක විපාක දෙන කර්මයයි.
(2) ඊළඟ භවයේ දී ම විපාක දෙන කර්මයයි.
(3) මේ භවයේ දී ම විපාක දෙන කර්මයයි.
(4) විපාක දීමට අවස්ථාවක් නොයෙදෙන කර්මයයි.

34. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ 'සම්මා කම්මන්ත' මාර්ග අංගයෙන් අර්ථවත් වන්නේ,
(1) සතුන් වෙළෙඳාම, අවි ආයුධ වෙළෙඳාම ආදියෙන් වැළකීමයි.
(2) ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාරයෙන් වැළකීමයි.
(3) බොරු කීම, කේලම් කීම, හිස් වචන කීමෙන් වැළකීමයි.
(4) කායානුපස්සනා ආදියෙහි සිත පිහිටුවා ගැනීමයි.

35. සත්ත්වයා සසරට බැඳ තබන සංයෝජන ධර්ම අතර ඕරම්භාගිය සංයෝජනයන්ට අයත් 'කාමරාග' යන්නෙන් අර්ථවත් වන්නේ,
(1) මෙලොව, පරලොව ඇතුළු සියලු දේ පිළිබඳ ඇති සැකයයි.
(2) අරූපී භවයට ඇති ඇල්මයි.
(3) සිත එක් අරමුණක තබා ගැනීමට ඇති අපහසුතාවයි.
(4) පංච ඉන්ද්‍රියයන්ගෙන් විඳින රූපාදී අරමුණු පිළිබඳ ඇතිවන ඇල්මයි.

36. සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම පිණිස පවත්වන ලද පළමුවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල අතරට අයත් නොවන්නේ,
(1) ධර්මය සහ විනය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාම පිණිස වගකීම් පැවරීමයි.
(2) භික්ෂූන් වහන්සේලා නිකාය වශයෙන් බෙදී යාමයි.
(3) ධර්මය හා විනය ගුරුවරයා වශයෙන් සැලකීමට තීරණය කිරීමයි.
(4) ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩනය පැනවීමට තීරණය කිරීමයි.

37. ධර්ම දේශකයන් වහන්සේ සතු ගුණාංග අතර 'අනුද්දයතං පටිච්ච' යන්නෙන් අර්ථවත් වන්නේ,
(1) අනුකම්පා පෙරදැරිව දහම් දෙසිය යුතු ය.
(2) හාත්පසින් කරුණු ගෙනහැර පාමින් දහම් දෙසිය යුතු ය.
(3) තමා හුවා දක්වමින් අනුන් හෙළා දකිමින් දහම් නොදෙසිය යුතු ය.
(4) අනුපිළිවෙළ කතාවට අනුව දහම් දෙසිය යුතු ය.

38. මහා පරිනිබ්බාන සූත්‍රයේ 'පොරාණ වජ්ජිධම්ම' ලෙස සඳහන් වන්නේ,
(1) දස සක්විතිවත් ය. (2) දස රාජ ධර්මයන් ය.
(3) සප්ත අපරිහානිය ධර්මයන් ය. (4) සතර සංග්‍රහ වස්තූන් ය.

39. උපසම්පන්න භික්ෂූන් වහන්සේලා සිව්නමකට හෝ ඊට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් සිදුකරනු ලබන උපෝසථ කර්මය වූයේ,
(1) සංඝ උපෝසථයයි. (2) ගණ උපෝසථයයි.
(3) පුග්ගල උපෝසථයයි. (4) සාමග්ගි උපෝසථයයි.


40. ෂඩ් ශාස්තෘන් වහන්සේලා අතර පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යන සප්ත පදාර්ථයන් ලෝකයේ පවතී යන ඉගැන්වීම ප්‍රකට කළේ,
(1) අජිත කේසකම්බලී ය. (2) පකුධ කච්චායන ය.
(3) සංජය බෙල්ලට්ඨිපුත්ත ය. (4) නිගණ්ඨනාථපුත්ත ය.

වගුව 2.1 I ප්‍රශ්න පත්‍රය සඳහා නිවැරදි පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 3 | 21. | 1 |
| 02. | 2 | 22. | 2 |
| 03. | 4 | 23. | 4 |
| 04. | 2 | 24. | 3 |
| 05. | 1 | 25. | 4 |
| 06. | 3 | 26. | 1 |
| 07. | 1 | 27. | 3 |
| 08. | 3 | 28. | 3 |
| 09. | 3 | 29. | 1 |
| 10. | 4 | 30. | 2 |
| 11. | 1 | 31. | 1 |
| 12. | 3 | 32. | 3 |
| 13. | 2 | 33. | 1 |
| 14. | 2 | 34. | 2 |
| 15. | 4 | 35. | 4 |
| 16. | 3 | 36. | 2 |
| 17. | 2 | 37. | 1 |
| 18. | 1 | 38. | 3 |
| 19. | 3 | 39. | 1 |
| 20. | 3 | 40. | 2 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

## 2.3 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය




**ප්‍රස්තාරය 2.1 1 පත්‍රයේ ප්‍රශ්නවල පහසුතා දර්ශක**
**(RD/16 /5 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)**

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
අපේක්ෂකයන් වැඩි ම සංඛ්‍යාවක් නිවැරදි පිළිතුරු සපයා ඇති 1 ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.90කි. එනම් 1 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 90%ක් නිවැරදි පිළිතුර සපයා ඇත. ඒ අනුව ප්‍රශ්නයේ පහසුතාව 90%ක් ලෙස දැක්විය හැකි ය.

වගුව 2.2 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | Missing |
| 1 | 3 | 2.46 | 4.71 | 89.63 | 2.89 | 0.32 |
| 2 | 2 | 9.73 | 49.52 | 27.70 | 12.30 | 0.75 |
| 3 | 4 | 8.13 | 6.10 | 5.24 | 79.89 | 0.64 |
| 4 | 2 | 3.96 | 88.56 | 5.13 | 2.14 | 0.21 |
| 5 | 1 | 82.35 | 6.42 | 6.84 | 3.85 | 0.53 |
| 6 | 3 | 32.09 | 22.78 | 31.55 | 12.83 | 0.75 |
| 7 | 1 | 54.87 | 5.45 | 30.37 | 8.88 | 0.43 |
| 8 | 3 | 32.19 | 8.98 | 50.37 | 8.13 | 0.32 |
| 9 | 3 | 19.79 | 10.05 | 47.27 | 22.46 | 0.43 |
| 10 | 4 | 13.69 | 9.73 | 16.47 | 59.14 | 0.96 |
| 11 | 1 | 71.34 | 8.34 | 6.42 | 13.16 | 0.75 |
| 12 | 3 | 19.47 | 27.49 | 35.72 | 16.36 | 0.96 |
| 13 | 2 | 5.99 | 54.65 | 32.94 | 5.88 | 0.53 |
| 14 | 2 | 11.66 | 45.45 | 19.25 | 22.89 | 0.75 |
| 15 | 4 | 8.56 | 25.99 | 7.59 | 57.11 | 0.75 |
| 16 | 3 | 3.85 | 8.88 | 61.60 | 24.92 | 0.75 |
| 17 | 2 | 6.84 | 33.58 | 47.27 | 11.55 | 0.75 |
| 18 | 1 | 48.98 | 22.99 | 14.01 | 12.83 | 1.18 |
| 19 | 3 | 11.34 | 18.50 | 42.03 | 27.70 | 0.43 |
| 20 | 3 | 6.20 | 9.84 | 78.61 | 4.92 | 0.43 |
| 21 | 1 | 72.51 | 13.05 | 10.80 | 3.10 | 0.53 |
| 22 | 2 | 11.12 | 46.95 | 10.27 | 31.02 | 0.64 |
| 23 | 4 | 15.40 | 9.20 | 10.37 | 64.49 | 0.53 |
| 24 | 3 | 29.41 | 13.05 | 36.68 | 19.79 | 1.07 |
| 25 | 4 | 10.16 | 13.37 | 10.59 | 65.67 | 0.21 |
| 26 | 1 | 31.98 | 34.33 | 14.65 | 18.50 | 0.53 |
| 27 | 3 | 14.76 | 25.03 | 42.35 | 17.54 | 0.32 |
| 28 | 3 | 35.72 | 14.44 | 35.94 | 13.37 | 0.53 |
| 29 | 1 | 36.58 | 25.67 | 20.11 | 17.11 | 0.53 |
| 30 | 2 | 25.78 | 31.98 | 28.88 | 12.09 | 1.28 |
| 31 | 1 | 67.06 | 12.30 | 10.80 | 8.77 | 1.07 |
| 32 | 3 | 11.66 | 46.63 | 32.83 | 8.56 | 0.32 |
| 33 | 1 | 45.88 | 30.80 | 12.94 | 10.05 | 0.32 |
| 34 | 2 | 49.63 | 21.60 | 9.20 | 19.25 | 0.32 |
| 35 | 4 | 8.13 | 8.66 | 11.76 | 71.23 | 0.21 |
| 36 | 2 | 6.84 | 48.77 | 9.41 | 34.76 | 0.21 |
| 37 | 1 | 32.30 | 17.43 | 17.01 | 33.05 | 0.21 |
| 38 | 3 | 11.23 | 24.28 | 53.26 | 10.48 | 0.75 |
| 39 | 1 | 53.69 | 20.96 | 10.59 | 14.44 | 0.32 |
| 40 | 2 | 18.50 | 29.09 | 26.20 | 25.56 | 0.64 |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත. 'Missing' තීරයේ දක්වා ඇත්තේ කිසිදු වරණයක් තෝරා නොගත් හෝ එක් වරණයකට වඩා තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතයයි

## 2.4 තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය

ත්‍රිපිටක ධර්මය විෂයයෙහි 1ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න 40 ක් ඇතුළත් වන අතර ඒ ඒ තේමා අනුව එම ප්‍රශ්න 40 සකස් වී ඇති ආකාරය පහත වගුවේ සඳහන් කර ඇත.


**වගුව 2.3 තේමාව හා ඊට අදාළ ප්‍රශ්න අංක**

| තේමාව/ විෂය ක්ෂේත්‍රය | ප්‍රශ්න අංකය | ප්‍රශ්න එකතුව |
|---|---|---|
| බුද්ධ චරිතය | 1,2,3 | 03 |
| තෙරුවන ගුණ | 5,6 | 02 |
| චරිත කතා | 4,7,8,9,10 | 05 |
| සූත්‍ර ධර්ම | 15,16,17,18,19,38 | 06 |
| විනය | 11,12,13,14,39 | 05 |
| අභිධර්මය | 24,25,27 | 03 |
| ධම්මපදය | 20,21,22 | 03 |
| භාවනා | 30,31 | 02 |
| ධර්මය(දහම් කරුණු) | 23,26,32,33,34,35,37 | 07 |
| ශාසන ඉතිහාසය | 28,29,36,40 | 04 |
| එකතුව | | 40 |

ප්‍රශ්න 40න් ප්‍රශ්න 07ක් 'ධර්මය' තේමාව යටතේ ද ප්‍රශ්න 06ක් 'සූත්‍රධර්ම' තේමාව යටතේ ද ඉදිරිපත් කර ඇත. 'භාවනා'හා 'තෙරුවන ගුණ' යන තේමාවන් යටතේ ප්‍රශ්න 2 බැගින් ඉදිරිපත් කර ඇත.


**වගුව 2.4 තේමා අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්නයෙහි අංකය සහ ඒවායේ පහසුතාව**

| තේමාව | පහසුතාව වැඩිම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව |
|---|---|---|
| බුද්ධ චරිතය | 1- (90%) | 2 - (50%) |
| තෙරුවන ගුණ | 5 - (82%) | 6 - (32%) |
| චරිත කතා | 4 - (89%) | 9 - (47%) |
| සූත්‍ර ධර්ම | 16 - (62%) | 17 - (34%) |
| විනය | 11 - (71%) | 12 - (36%) |
| අභිධර්මය | 25 - (66%) | 24 - (37%) |
| ධම්මපදය | 20 - (79%) | 22 - (47%) |
| භාවනා | 31- (67%) | 30 - (29%) |
| ධර්මය (දහම් කරුණු) | 35 - (71%) | 37 - (17%) |
| ශාසන ඉතිහාසය | 36 - (49%) | 40 - (29%) |




ප්‍රස්තාරය 2.2 (RD/16/5/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි)

ත්‍රිපිටක ධර්මය විෂයයෙහි I ප්‍රශ්න පත්‍රයේ වැඩි ම ප්‍රශ්න සංඛ්‍යාවක් 'ධර්මය' තේමාව යටතේ ඉදිරිපත් කර තිබූ අතර සමස්ත I ප්‍රශ්න පත්‍රයේ පහසුතාව අඩු ම ප්‍රශ්නය ද මෙම තේමාව යටතේ ඉදිරිපත් වී ඇත. එය පහසුතාව 17%ක් වූ 37 වන ප්‍රශ්නයයි.
බුද්ධ චරිතය තේමාව යටතේ I පත්‍රයේ ඇතුළත්ව ඇති ප්‍රශ්න සංඛ්‍යාව තුනක් වන අතර 90% ක වැඩිම පහසුතාවක් සහිත පළමු වැනි ප්‍රශ්නය ද බුද්ධ චරිතය ඇසුරින් විමසා ඇත.




**ප්‍රස්තාරය 2.3**

ත්‍රිපිටක ධර්මය I පත්‍රය සැකසීමේ දී පදනම් කරගත් තේමා 10 අතුරෙන් එක් එක් තේමාවට අයත් ප්‍රශ්නවල පහසුතාව සලකා එක් එක් තේමාවෙහි සාමාන්‍ය පහසුතාව හා එම තේමාව යටතේ ඉදිරිපත් වී තිබූ ප්‍රශ්න ප්‍රමාණය මෙම ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත.

1 පත්‍රයේ වැඩිම ප්‍රශ්න සංඛ්‍යාවක් ඇතුළත්ව තිබූ ධර්මය තේමාවට අදාළව 18%ක ප්‍රමාණයේ ප්‍රශ්න ප්‍රතිශතයක් ඉදිරිපත් වී තිබූ අතර එම තේමාවට අදාළ ප්‍රශ්නවල සාමාන්‍ය පහසුතාව 41% කි.

ශාසන ඉතිහාසය තේමාව මෙම තේමා 9 අතුරෙන් සාමාන්‍ය පහසුතාව අඩුම තේමාව වන අතර එහි සාමාන්‍ය පහසුතාව 38%කි. එම තේමාව යටතේ ඉදිරිපත් වී තිබූ ප්‍රශ්න ප්‍රමාණය සමස්ත 1 ප්‍රශ්න පත්‍රයේ ප්‍රමාණයෙන් 10%කි. වැඩිම සාමාන්‍ය පහසුතාවක් එනම් 73%ක් බුද්ධ චරිතය තේමාවට අදාළ ප්‍රශ්න සඳහා ඇති නමුත් I ප්‍රශ්න පත්‍රයේ එම තේමාවට අදාළව ඉදිරිපත් ව තිබූ ප්‍රශ්න ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 8%කි.

## 2.5 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

I පත්‍රයේ 1 ප්‍රශ්නයෙහි පහසුතාව 90%කි. එය I පත්‍රයේ ප්‍රශ්න 40 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නයයි. 5 ශ්‍රේණියේ පළමු පාඩම බුද්ධ චරිතය වීම නිසා වැඩි අවධානයක් යොමුවන පාඩමක් වීමත් ප්‍රශ්නයේ වණුකදෙහි එන පාලි වචන ත්‍රිත්වය මගින් පිළිතුරු අනුමාන කර තෝරා ගැනීමට හැකි වීමත් මෙහි ඉහළ පහසුතාවට හේතුවී තිබිය හැකිය.

පළමු ප්‍රශ්නය හැරුණු කොට 3,4,5,20 යන ප්‍රශ්නවල පහසුතාව 75%ට වඩා වැඩිය. මෙම ප්‍රශ්න සැකසී ඇති විෂය කරුණු ඉතා ප්‍රකට නිතර භාවිතා වන විෂය සන්ධාරයට ඇතුළත් කරුණු වීම මෙම ඉහළ පහසුතාවට හේතු විය හැකිය.

විනය කොටසින් සැකසී ඇති 11 ප්‍රශ්නයෙහි පහසුතාව 71%කි. විනය කොටස පිළිබඳ වැඩි සැලකිල්ලක් හා අවධානයක් දැක්වීම ගුරු සිසු දෙපක්ෂයෙන්ම සිදු කිරීමද මෙම ඉහළ පහසුතාවට හේතු වී ඇතැයි අනුමාන කළ හැකිය. ධම්මපදයෙන් සැකසී ඇති 21 ප්‍රශ්නය හා අභිධර්මය කොටසින් සැකසී ඇති 35 ප්‍රශ්නය සඳහා පහසුතාව 70%ට වඩා වැඩිය. අපේක්ෂකයන්ට වඩා හොඳින් ග්‍රහණය කරගත හැකි ලෙස ධම්මපද ගාථා නිදාන කතා සහිතව දක්වා තිබීමත්, වණපොත් කිරීමත් , දසසංයෝජන ධර්ම නිතර ඇසෙන කතා කරන ධර්ම කරුණක් නිසාත් මෙම ප්‍රශ්න සඳහා ශිෂ්‍ය සාධනය වැඩි වී ඇති බව අනුමාන කළ හැකිය.

කාලාම සූත්‍රය ඇසුරෙන් සකස් කර ඇති 16 ප්‍රශ්නයෙහි පහසුතාව 62%කි. 25%ක් පමණ සැලකිය යුතු අපේක්ෂකයන් පිරිසක් වැරදි වරණය වන 4 වරණය තෝරාගෙන ඇත. නිවැරදි පිළිතුර වන 3 වරණය හා වැරදි පිළිතුරක් වන 4 වරණයක් අතර මතුපිට වාච්‍යාර්ථය බැලූ බැල්මට සමානතාවක් පෙන්වීම නිසා අපේක්ෂකයන් වැරදි වරණයක් තෝරාගෙන ඇතැයි උපකල්පනය කළ හැකිය.

2 ප්‍රශ්නයේ පහසුතාව 50%කි. එය බුද්ධ චරිතය විෂය කොටසින් සකස් වී ඇති අතර එහි නිවැරදි වරණය 2 වරණයයි. වැරදි වරණයක් වන 3 වරණයද අපේක්ෂකයන් 28%ක් පමණ තෝරාගෙන ඇත. 3 වරණයේ සඳහන් පිළිතුරෙහි ඇතුළත් ධර්ම කරුණ නිතර භාවිතයේ එන ප්‍රකට කරුණක් නිසා එය නිවැරදි පිළිතුර ලෙස ලකුණු කර ඇතැයි උපකල්පනය කළ හැකිය.

ශ්‍රාවක චරිත ඇසුරෙන් සකස් කර ඇති 7 ප්‍රශ්නයෙහි පහසුතාව 55%කි. නිවැරදි වරණය 1 වේ. වැරදි වරණයක් වන 3 වරණය ද අපේක්ෂකයන් 30%ක් පමණ තෝරාගෙන ඇත. ධර්ම සේනාපති හා ධර්ම භාණ්ඩාගාරික යන තනතුරු පිළිබඳ නිරවුල් අවබෝධයක් නොමැති වීම නිසා වැරදි වරණය තෝරාගෙන ඇති බව සිතිය හැකිය.

12 ප්‍රශ්නය විනය කොටසින් සකස් කර ඇති අතර පහසුතාව 36%කි. එහි නිවැරදි වරණය 3 වරණය වන අතර 2 වරණය ද 27%ක අපේක්ෂකයන් සංඛ්‍යාවක් තෝරාගෙන ඇත. විනය පිටකයේ පාරිභාෂික වචන මාලාව පිළිබඳ අපේක්ෂකයන් තුළ නිවැරදි අවබෝධයක් නොමැති වීම මේ සඳහා හේතු වී තිබිය හැකි බව උපකල්පනය කළ හැකිය.

පරාභව සූත්‍රය ඇසුරින් සකස් කරන ලද 17 ප්‍රශ්නයේ පහසුතාව 34%කි. 2 පිළිතුර නිවැරදි වරණය වුවත් 3 වරණය නිවැරදි පිළිතුර ලෙස තෝරාගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 47%ක තරම් ඉහළ අගයකි. ප්‍රකට සූත්‍ර ධර්මයක් වුවත් පාලි ගාථාවල වාච්‍යාර්ථය පිළිබඳ නිවැරදි පැහැදිලි අවබෝධයක් අපේක්ෂකයා තුළ නොමැති වීම මේ සඳහා හේතු වී තිබිය හැකිය.

32 ප්‍රශ්නයේ පටිච්ච සමුප්පාදය ඇසුරෙන් සැකසී ඇති අතර එහි දී ප්‍රශ්න කොට ඇත්තේ "උපාදාන" යන වචනයෙහි දැඩිව අල්ලාගැනීම යන අර්ථයයි. ප්‍රශ්නය නිවැරදිව තේරුම් නොගැනීම නිසා නිවැරදි වරණය තෝරා ඇත්තේ 33% කි. 2 වරණය 47% අපේක්ෂකයන් පිරිසක් තෝරා ඇත. උපාදානය හේතුවෙන් භවය ඇතිවන බව පටිච්ච සමුද්පාදයේ "උපාදාන පටිච්ච භවෝ යන පාඨය" වරදවා තේරුම් ගැනීම එයට හේතු වී ඇතැයි සිතිය හැකිය.

34 ප්‍රශ්නය ආර්ය  අෂ්ටාංගික මාර්ගය ඇසුරෙන් " සම්මා කම්මන්ත" යන්නෙහි අර්ථය විමසා ඇත. එහි නිවැරදි වරණය තෝරා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 22% කි. සම්මා කම්මන්ත යනු කයින් සිදුවන වැරදි තුනෙන් ඉවත් වීමයි. එහෙත් අපේක්‍ෂකයා සම්මා කම්මන්ත යනු කර්මාන්ත හෙවත් ජීවත් වීම සඳහා කරන රැකියාවන් යැයි සිතා පළමු වරණය වූ වැරදි ප්‍රතිචාරය තෝරා ඇත. එය ප්‍රතිශතයක් ලෙස 47%ක් තරම් ඉහළ අගයකි.

37 ප්‍රශ්නයෙන් දහම් කරුණු විෂය කොටස යටතේ ධර්ම දේශකයන් වහන්සේ සතු ගුණාංග අතර ඇති "අනුද්දයතං පටිච්ච " යන වචනයෙහි අර්ථය විමසා ඇත එහි දී නිවැරදි පිළිතුර තෝරා ඇත්තේ 32% කි.

4 වන වරණය නිවැරදි පිළිතුර ලෙස අපේක්ෂකයන්ගේ 33%ක් තෝරා ගෙන ඇත. සුවිශේෂිව වචනයේ අර්ථය මතුකරගෙන ප්‍රශ්නය නිවැරදිව තේරුම් නොගැනීමත්, ධර්ම දේශකයන් වහන්සේ සතු ගුණාංග ගැන වැඩි අවධානයක් යොමු කිරීමත් මෙම වැරදි වරණයට යොමුවීමට හේතු විය හැකිය.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**II පත්‍රය - කාලය : පැය 03යි**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.

I කොටස - **පළමුවන** ප්‍රශ්නය අනිවාර්යය වේ. කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 10කින් සමන්විත ය. එක් නිවැරදි පිළිරකට ලකුණු 02 බැගින් ලකුණු 2ක් හිමි වේ.

II කොටස - ව්‍යුහගත රචනා ප්‍රශ්න **තුනකින්** සමන්විත වන අතර ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටසේ ප්‍රශ්නවලින් බුද්ධ චරිතය, චරිත කතා, ශාසන ඉතිහාසය, විනය යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය කෙරේ. එක් නිවැරදි පිළිතුරකට උපරිම ලකුණු 10 බැගින් ලකුණු 20ක් හිමි වේ


III කොටස - ව්‍යුහගත රචනා ප්‍රශ්න **තුනකින්** සමන්විත වන අතර ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටසේ ප්‍රශ්නවලින් සූත්‍ර, භාවනා, අභිධර්මය, ධම්ම පදය හා මූලික ඉගැන්වීම් යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය කෙරේ. එක් නිවැරදි පිළිතුරකට උපරිම ලකුණු 10 බැගින් ලකුණු 20ක් හිමි වේ

II පත්‍රය සඳහා මුළු ලකුණු = 20 + 20 + 20 = 60

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 40 |
| II පත්‍රය | = | 60 |
| අවසාන ලකුණ | = | 100 |

## 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය




• II පත්‍රයේ පළමු වැනි ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර අපේක්ෂකයන් අතුරෙන් 98.13%ක් පමණ එම ප්‍රශ්නය තෝරාගෙන ඇත.

• II ප්‍රශ්න පත්‍රයේ II කොටසට ප්‍රශ්න අංක 2,3 හා 4 ලෙස ප්‍රශ්න තුනක් ඇතුළත් වන අතර එයින් 2 ප්‍රශ්නය බුද්ධ චරිතය ඇසුරෙන් ද, 3 ප්‍රශ්නය ශ්‍රාවක චරිත ඇසුරෙන්ද 4 ප්‍රශ්නය විනය කොටස් ඇසු-රෙන්ද සකස් කර ඇත.

• II ප්‍රශ්න පත්‍රයේ III කොටසටද ප්‍රශ්න අංක 5,6 හා 7 ලෙස ප්‍රශ්න තුනක් ඇතුළත් වන අතර එයින් 5 ප්‍රශ්නය ධම්ම පදය ඇසුරෙන්ද, 6 ප්‍රශ්නය ශාසන ඉතිහාසය ඇසුරෙන්ද, 7 ප්‍රශ්නය අභිධර්මය ඇසුරෙන්ද සකස් කර ඇත.

ප්‍රස්තාරය 3.1 (RD/ 16 / 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)


• බුද්ධ චරිතය ඇසුරෙන් සකස් කර ඇති දෙවැනි ප්‍රශ්නය අපේක්ෂකයන් 91.25%ක් තෝරාගෙන ඇත. බුද්ධ චරිතය කතාවක ස්වරූපයෙන් ලිය වී තිබීමත් අපේක්ෂකයන්ගේ මතකයේ රැඳෙන බැවින් ඉතා පහ-සුවෙන් ලකුණු ලබාගැනීමට හැකියාව තිබීමත් එම ප්‍රශ්නය වැඩි අපේක්ෂකයන් පිරිසක් තෝරාගැනීමට හේතු වී ඇතැයි සිතිය හැකි ය.

• අඩුම අපේක්ෂකයන් සංඛ්‍යාවක් තෝරාගෙන ඇත්තේ ධම්මපදය ඇසුරෙන් සකස් කර ඇති පස්වැනි ප්‍රශ්නයයි. එය II පත්‍රයේ III කොටසට අයත්ය. මෙම කොටසේ හයවන ප්‍රශ්නය ශාසන ඉතිහාසය ඇසු-රෙන් සකසා ඇති අතර එයට අදාළ විෂය කරුණු නිතරම අවධානයට යොමුවන බැවින් පහසුවෙන් පිළිතුරු ලිවීමට හැකි වනු ඇතැයි සිතා වැඩි අපේක්ෂකයන් පිරිසක් මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති බවට උපකල්පනය කළ හැකිය.

තවද අභිධර්මය ඇසුරෙන් සැකසූ ප්‍රශ්නයක් වුවද 7 ප්‍රශ්නයද ඉතා කෙටියෙන් පිළිතුරු සැපයිය හැකි බැලු බැල්මට පහසු ප්‍රශ්නයක් ලෙස හැඟෙන බැවින් 5 ප්‍රශ්නයට වඩා මෙම ප්‍රශ්නයද වැඩි අපේක්ෂකයන් පිරිසක් තෝරා ගැනීමට යොමු වූ බව සිතිය හැකිය.

• 5 ප්‍රශ්නයට පිළිතුරු ලෙස ගාථාවේ තේරුම හා නිදාන කථාව ඇතුළත් දීර්ඝ විස්තරයක් නිවැරදිව ඉදිරිපත් කළ යුතු නිසාත්, III කොටසේ 6,7 ප්‍රශ්න දෙකට වඩා පහසුවෙන් පිළිතුරු සැපයීම කළ හැකි බවට අපේක්ෂකයන් අනුමාන කර ඇති නිසාත් 5 ප්‍රශ්නය අඩු අපේක්ෂකයන් ප්‍රතිශතයක් තෝරා ගැනීමට හේතු වී තිබේ යැයි උපකල්පනය කළ හැකිය.

## 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 3.2 (RD / 16/ 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

මෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඒ සඳහා ලකුණු 20ක් ලබා දී ඇත. 2 සිට 7 දක්වා ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 10බැගින් ලබා දී ඇත.


මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

1 ප්‍රශ්නයට හිමි ලකුණු 20, 0 -5, 6 - 10, 11- 15, 16 - 20 යන පන්ති ප්‍රාන්තර 4කට වෙන් කර ඇති අතර එම පන්ති ප්‍රාන්තර අනුව පිළිවෙළින් ලකුණු ප්‍රතිශතයක් ලෙස 00 - 25%, 26 - 50% ,51 - 75% හා 76 -100% යන ලකුණු පරාස හතරකට වෙන් කර ඇත. ඒ අනුව මුළු ලකුණු 20 න් ලකුණු 6 - 10 අතර ලකුණු ලබා ඇති එනම් ලකුණු 20න් 26 - 50% ත් අතර ලකුණු ලබා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 38% කි.

2 ප්‍රශ්නයට හිමි ලකුණු 10, 0 -2, 3- 5, 6- 7, 8 - 10, යන පන්ති ප්‍රාන්තර 4කට වෙන් කර ඇති අතර එම ප්‍රාන්තර අනුව ලකුණු ප්‍රතිශතයක් ලෙස 00 - 25%, 26 - 50% ,51 - 75% හා 76 -100% යන ලකුණු පරාස හතරකට වෙන් කර ඇත. ඒ අනුව මුළු ලකුණු 10 න් ලකුණු 3 - 5 ත් අතර ලකුණු ලබා ඇති එනම් ලකුණු 10න් 26 - 50% ත් අතර ලකුණු ලබා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 45%කි.

එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ඉදිරි පිටුවල අන්තර්ගත වේ.

## 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 3.3

(RD/ 16/ 4 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

1 ප්‍රශ්නයේ (iv) කොටසේ පහසුතා දර්ශකය 0.79කි. එනම් 1(iv) කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 79%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම ප්‍රශ්නයේ පහසුතාව 79%කි.

## 3.5. II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය

**1. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

**(i) බුදුරජාණන් වහන්සේ 'අරහං'යැයි පැවසීමට හේතු දෙකක් දක්වන්න**

- කෙනෙකු පිළිකුල් සහගත දේකින් ,බියකරු තැනකින් ඈත්වන්නා සේ කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින්ද
- සතුරන් නසන රණශූරයකු සේ තමා තුළ වූ කෙලෙස් සතුරන් නැසූහෙයින්ද
- සංසාර චක්‍රයේ ගරාදී හෙවත් අවිද්‍යාදී ධර්ම සිඳලූ හෙයින් ද
- සියලු පූජාවන් ලැබීමට සුදුසු වූ උතුම් පූජනීයයන් වහන්සේ වූ හෙයින් ද
- සිතින් , කයින් හෝ වචනයෙන් රහසින්වත් පව් නොකරන හෙයින් ද

**මේ අතරින් දෙකක් සඳහා (ලකුණු 02යි)**

**(ii)"කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මඤ්ඤූ හොති" - මහණෙනි, මේ ශාසනයෙහි යම් භික්ෂුවක් කෙසේ නම් ධර්මය දන්නේ වෙයි ද යන්නෙහි ඇතුළත් නවාංග ශාස්තෘ ශාසනයේ අංග දෙකක් ලියන්න.**

- සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක ජාතක, අබ්භූතධම්ම හා වේදල්ල

**මේ අතරින් දෙකක් සඳහා (ලකුණු 02යි)**

**(iii) උපෝසථ කර්මයක් ආරම්භ කිරීමට පෙර භික්ෂූන් වහන්සේලා විසින් සම්පූර්ණ කළ යුතු මූලික අවශ්‍යතා දෙක නම් කරන්න.**

- පුබ්බකරණ හා පුබ්බකිච්ච

**(ලකුණු 02යි)**

**(iv) තීර්ථකයන්ගේ මානය බිඳ හෙළීමට ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමට බුදුරදුන්ගෙන් අනුමැතිය ඉල්ලා සිටි භික්ෂුණීන් වහන්සේ නම් කොට, ඇය ලැබූ අග තනතුර ලියන්න.**

- උත්පලවණ්ණා රහත් තෙරණිය
- ඍද්ධිමත් භික්ෂුණීන් අතර අගතනතුර

**(ලකුණු 02යි)**

**(v) 'සීලබ්බතපරාමාස' යන්නෙහි ඇතුළත් ව්‍රත චර්යා දෙකක් නම් කරන්න.**

- ගෝ ව්‍රත, කුක්කුර ව්‍රත, අජව්‍රත

**මෙබඳු ව්‍රත චර්යා දෙකක් සඳහා (ලකුණු 02යි)**

**(vi) බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගෙන් ආධ්‍යාත්මික පිහිට ලැබිය හැකි පුද්ගලයන් හඳුනාගන්නේ මහකරුණා සමාපත්තියට සමවැදීමෙනි.එසේ උන්වහන්සේගෙන් පිහිට ලද තැනැත්තන් දෙදෙනකු සඳහන් කරන්න.**

- පූතිගත්තතිස්ස තෙරුන්, සෝපාක, මට්ටකුණ්ඩලී

**ආදීන්ගෙන් දෙදෙනෙක් සඳහා (ලකුණු 02යි)**

**(vii)** සංස්කාරයන්ගේ **හෙවත් රැස් වී එකතු වී සකස් වන ධර්මයන්ගේ ප්‍රධාන ලක්ෂණ දෙකක් දක්වන්න.**

- උප්පාදො පඤ්ඤායති - හට ගැනීමක් පෙනේ
- වයො පඤ්ඤායති - නැසීමක් පෙනේ
- ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති - තිබූ දෙයක් වෙනස් වූ බවක් පෙනේ

**මේ අතරින් දෙකක් සඳහා(ලකුණු 02යි)**

**(viii) "යථා දණ්ඩෙන ගොපාලො - ගාවො පාචෙති ගොචර,**
**එවං ජරා ච මච්චු ච - ආයුං පාචෙන්ති පාණිනං**
**යම් සේ ගොපල්ලෙක් කෙවිටෙන් ගවයන් තණබිම් කරා දක්කන්නේ ද එසේ ම**
**සත්ත්වයන්ගේ ආයුෂ ද ක්ෂය කොට දමති."**

**ඉහත ගාථාවේ සඳහන් සත්ත්වයන්ගේ ආයුෂය ක්ෂය කොට දමන ධර්මතා දෙක ලියන්න.**

- **ජරා -** ජරා ධර්මතාව
- **මච්චු -** මරණ ධර්මතාව

**(ලකුණු 02යි)**

**(ix)** 'සෝපධිසේස' **නිර්වාණය සාක්ෂාත් කරගත හැකි ආකාර දෙකක් දක්වන්න.**

- සම්මා සම්බුද්ධත්වයට පත්වීමෙන්
- පසේ බුද්ධත්වයට පත්වීමෙන්
- අරහත්වයට පත්වීමෙන්

**මේ අතරින් දෙකක් සඳහා(ලකුණු 02යි)**


**(x) "උත්සාහයෙන් ධනය උපයා සුරක්ෂිත වූ ධනයක් සහිතව වෙසෙන පුද්ගලයා අන්තගාමී පරිභෝජනයකට නොයා යුතුය." ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ධන පරිභෝජනයෙහිලා ඉගැන්වෙන අන්ත දෙක නම් කරන්න.**

- උදුම්බරඛාදික
- අජද්ධුමාරික

**(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 02×10 = 20යි)**

### 3.5.1 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





**ප්‍රස්තාරය 3.4 (a)**

II පත්‍රයේ පළමු ප්‍රශ්නය සියලුම අපේක්ෂකයන් පිළිතුරු සැපයිය යුතු අනිවාර්ය ප්‍රශ්නයක් වේ. අංක 3.1 ප්‍රස්තාරය අනුව මේ ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රමාණය 98.13% කි. මෙම ප්‍රශ්නයට අනුකොටස් 10ක් ඇතුළත් අතර ඒ සඳහා ලකුණු 20ක් හිමිවේ. ඉන්

00 - 05 ප්‍රාන්තරයේ 26%ක් ද,
06 - 10 ප්‍රාන්තරයේ 38%ක් ද,
11 - 15 ප්‍රාන්තරයේ 23%ක් ද,
16 - 20 ප්‍රාන්තරයේ 13%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 36%ක් වන අතර අපේක්ෂකයන් 64%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.4 (b)

- මෙම ප්‍රශ්නය කොටස් දහයකින් සමන්විත ය. එම කොටස් ත්‍රිපිටක ධර්ම විෂයයට අයත් විවිධ විෂය තේමා යටතේ සකස් කර ඇත.

**වගුව 3.1 පළමු වැනි අනිවාර්ය ප්‍රශ්නයෙහි කොටස්වලට අදාළ විෂය තේමා**

| විෂය තේමාව | 1 ප්‍රශ්නයට අදාළ කොටස |
|---|---|
| බුද්ධ චරිතය | (i), (vi) |
| තෙරුවන ගුණ | (ii) |
| චරිත කතා | (iv) |
| සූත්‍ර ධර්ම | (x) |
| විනය | (iii) |
| අභිධර්මය | (ix) |
| ධම්මපදය | (viii) |
| භාවනා | (vii) |
| ධර්මය(දහම් කරුණු) | (v) |

• 1 ප්‍රශ්නයේ අනුකොටස් අතුරෙන් 79% වූ වැඩිම පහසුතාවක් සහිත ප්‍රශ්න අනුකොටස් වන්නේ (i)කොටසය නව අරහාදී බුදුගුණ ඇසුරින් මෙම ප්‍රශ්නය විමසා ඇත. එසේම බුදුගුණ අතර පළමුවෙන් කියවෙන ගුණය වන බැවින් හා 'අරහං' බුදු ගුණයෙහි අර්ථ බොහෝවිට අසා හුරු පුරුදු වීම මෙම කොටස සඳහා විෂය සාධන ය වැඩි වීමට හේතු වී තිබිය හැකිය.

• 1 ප්‍රශ්නයේ ii, iv,vi කොටස්හි පහසුතා පිළිවෙලින් 69% ,71%ක් හා 65%කි. එම කොටස්වල පහසුතාව සාපේක්ෂව ඉහළ අගයකි. ධර්මයෙහි මූලික බෙදීම් අතර කියවෙන නවාංග ශාස්තෘ ශාසනය බොහෝ අපේක්ෂකයන් කියවා වණපොත් කර තිබීම (ii) අනුකොටසෙහි ඉහළ සාධනයට හේතු වී තිබිය හැකිය. පෙළපොතෙහි ඇතුළත් අග්‍ර ශ්‍රාවිකාවන්ගේ චරිත කතා ඇසුරින් උත්පලවණ්ණා තෙරණින් වහන්සේ පිළිබඳ iv කොටසින් විමසා ඇත. එය ප්‍රකට චරිත කතාවක් සේම විභාගපේක්ෂකයන්ගේ ඉලක්ක මාතෘකාවක් වීම නිසා වැඩි සූදානමක් පැවතීම ඉහළ ශිෂ්‍ය සාධනයට හේතු විය හැකිය. vi කොටස බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණයෙන් පිහිට ලැබූවන් ඇසුරින් විමසා ඇත. බුදු සිරිත නිරන්තර විමසා බැලීමටත් ඒ හා සම්බන්ධ උතුම් ගුණාංග ඇසුරින් විවිධ දේශනා ශ්‍රවණයට හුරුවීමත් 65%ක ඉහළ පහසුතාවට හේතු විය හැකිය.

• iii සහ ix කොටස් සඳහා පහසුතාව 33%කි. සාපේක්ෂව බැලූ කල අඩු සාධනයක් මෙම ප්‍රශ්න දෙක සඳහා පෙන්නුම් කර ඇත. පිළිවෙලින් ධර්මය සහ අභිධර්මය ආශ්‍රිතව එම ප්‍රශ්න ඉදිරිපත් කර ඇත. මූලිකව අවබෝධ කරගත යුතු විනය දේශනා කොටස් වුවත් එයට වැඩි අවධානයක් යොමු නොකිරීම iii කොටසෙහි අඩු ශිෂ්‍ය සාධනයට හේතු වී තිබිය හැකිය. අභිධර්මය හා බුද්ධ චරිතය ආශ්‍රිතව සෝපධිසේස නිර්වාණය පිළිබඳ කරුණු පැහැදිලි කර ඇතත් ඒ පිළිබඳ අපේක්ෂකයන් වැඩි අවධානයක් යොමු නොකිරීම 33%ක තරම් සාපේක්ෂව අඩු පහසුතාවට හේතු වී තිබිය හැකිය.

• පහසුතාව අඩුම x කොටසෙහි පහසුතාව 18%කි. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි කියවෙන කරුණක් එම කොටසින් විමසා ඇත. එම සූත්‍ර දේශනාව හා ඉහත කරුණු නිරන්තර ශ්‍රවණයට අවකාශ ලැබෙන නමුත් පැහැදිලිව ප්‍රශ්නය අවබෝධ කර නොගැනීම මෙම අඩු පහසුතාවට හේතු වී තිබිය හැකි බව සිතිය හැකිය.

• v සහ vii කොටස් වල පහසුතාව පිළිවෙළින් 20%ක් හා 27% කි. එම ප්‍රශ්න කොටස් ධර්මය තේමාව ඇසුරින් ඉදිරිපත් කර ඇත. ධර්මයේ මූලික ඉගැන්වීම් හා ඒවායෙහි ගැඹුරු සංකල්ප පිළිබඳව අපේක්ෂකයන් වැඩි අධ්‍යයනයක් නොකිරීම අඩු ශිෂ්‍ය සාධනයට හේතු වී තිබිය හැකිය.

• පාලි පාඨ හා ගාථාවන්ගේ නිරවුල් අවබෝධයක් නොමැතිකම viii කොටසේ පහසුතාව 40%ක් වැනි සාපේක්ෂ අඩු අගයක් වීමට හේතු වි තිබිය හැකිය. එම කොටසෙහි ඉදිරිපත් කර ඇති ප්‍රශ්නයෙහි අදාළ පිළිතුර අන්තර්ගත වුවත් ඒ පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය මදිකම එම තත්ත්වයට හේතු වී තිබිය හැකි බව සිතිය හැකිය.

• මෙම ප්‍රශ්නය II පත්‍රයෙහි අනිවාර්ය ප්‍රශ්නයක් බැවින් 98.13%ක් පිළිතුරු සපයා ඇත. කොටස් සඳහා ලකුණු 20ක් ලබාගත හැකි වුවත් අපේක්ෂකයන්ගෙන් 64% ක් ලකුණු 10ක් හෝ ඊට වඩා අඩු ප්‍රමාණයක් ලබා ඇත. ලකුණු 16 - 20 අතර ලබා ඇත්තේ 13%ක් වැනි සුලු ප්‍රමාණයකි. ත්‍රිපිටක ධර්මය විෂය නිර්දේශයේ බොහෝ කොටස් ආවරණය වන පරිදි සකසා ඇති මෙම ප්‍රශ්නයට අපේක්ෂකයන් වැඩි ප්‍රමාණයක් සාර්ථකව ලකුණු ලබා නැති බව පැහැදිලි වේ. පාලි ගාථා හා පාඨවල අර්ථය අවබෝධවන ලෙස ඉගැන්වීම් කටයුතු සිදු කිරීමටත් යම් දහම් කරුණකට අදාළව ඇති කරුණු කිහිපයක් පහසුවෙන් මතකයේ තබා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත්ව ඉගැන්වීම් කටයුතු සිදු කිරීමත් මගින් සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි වනු ඇත. තවද අදාළ විෂය කරුණු නිරන්තර වණපොත් කිරීම මගින් මතක තබා ගැනීමට ශිෂ්‍යයන් හුරු කිරීමද ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමට ගත හැකි ක්‍රියාමාර්ගයකි.

## 2 ප්‍රශ්නය

**(i) බුදුරජාණන් වහන්සේ උත්තරීතර මනුෂ්‍යයෙකු ලෙස හැඳින්වීමට හේතු දෙකක් දක්වන්න.**

- කාමාදී ආශ්‍රවයන් සහමුලින් ප්‍රහීණ කිරීම
- ලෝකයෙහි සාමාන්‍ය මිනිසුන් අතර ඉපදී හෙළ පියුමක් ජලයෙහි නොගැවී, නොතැවරී තිබෙන්නා සේ මිනිසුන් අතර වැඩි මිනිසුන්ගෙන් ඉස්මතු වී ලෝකයා සමඟ නොගැටී, නොබැඳී
  ජීවත් වීම.
- සීල, සමාධි, පඤ්ඤා, විමුත්ති, විමුත්තිඤාණදස්සන ආදී ගුණයන්ගෙන් ශෝභාමත් වූ ශ්‍රේෂ්ඨ මනුෂ්‍ය රත්නයක් වීම.

**පිළිතුරු දෙකක් සඳහා (ලකුණු 02යි)**

**(ii) බුදුරදුන් තුළ පැවති නිහතමානී ගුණය ප්‍රකට කළ අවස්ථා තුනක් කෙටියෙන් පෙන්වා දෙන්න.**

- සම්මා සම්බුද්ධත්වය අවබෝධ කර ගැනීමෙන් පසු පස්වන සතිය අජපාල නුගරුක මුල වැඩ සිටිද්දී තමන්ගේ ගුරුවරයා ලෙස ක්‍රියා කළ හැකි අයෙකු ඇත්දැයි විමසා බලා ශීලාදී ගුණ දහමින් තමන් වහන්සේට වඩා උසස් කෙනෙකු නොමැති බව සලකා උතුම් වූ සද්ධර්මය ගුරුතැන්හි තබා ගැනීම.

- දානය සඳහා විශේෂ ආරාධනා නොලද සෑම දිනකම පිණ්ඩපාතයෙහි වැඩමවමින් රාජමාළිග යටත් දුගී පැලටත් කිසිදු භේදයකින් තොරව වැඩමවා මිහිරි බොජුන් මෙන්ම කටුක නීරස භෝජන පවා සමසිතින් වැළඳීම.
- තමන් වහන්සේ සියල්ලන් අතර ශ්‍රේෂ්ඨ වුවත් සිය ශ්‍රාවක පිරිස අතර සිටි විවිධ කුසලතා ඇති අය වෙත අගතනතුරු පිරිනැමීම.

- මහ කාශ්‍යප මහරහතන් වහන්සේ සමඟ චාරිකාවේ වැඩම කිරීමේදී අතර මගදී වැඩ සිටීමට සිනිඳු පට සිවුර නවා ආසන්නයක් පිළියෙල කිරීම. එහි වැඩ සිටි බුදුරදුන් මහාකාශ්‍යප තෙරුනගෙ සිවුර සිනිඳු බව පැවසූ පසු මහා කාශ්‍යප තෙරුන් එය බුදුරදුන්ට පූජා කොට උන්වහන්සේගේ හනනුලින් කළ සිවුර ලබා ගැනීමේ සිද්ධිය.

- බුදුරදුන් පිළිබඳ ප්‍රසාදයට පත් පුක්කුසාති රජතුමා බුදුරදුන් සොයා ගෙන පැමිණීම. තමන් වහන්-සේ හමුවට පැමිණීමට තරම් කාලයක් රජුට නොමැති බව සලකා උන්වහන්සේ රජුගේ පෙරමගට වැඩම කිරීම. දෙදෙනාම රාත්‍රියෙහි කුඹල්හලක නවාතැන් ගැනීම.රාත්‍රිය පුරාම රජු සමඟ බුදුගුණ සාකච්ඡා කිරීම. රජුට තමන් වහන්සේ බුදුරදුන් බව නොඇඟවීම මේ සිද්ධිය.

- බුදුරදුන් සැවැත්නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ සිටින සමයක ආයුෂ්මත් නන්දක තෙරුන් වහන්සේ උපස්ථාන ශාලාවේදී දැහැමි කථාවෙන් ශ්‍රාවකයන් වහන්සේලාට කරුණු දැක්වූ අවස්ථාව.

මේ අතරින් තුනක් සඳහා**(ලකුණු 03යි)**

**(iii) ''බුදුරජාණන් වහන්සේ අටලෝ දහමින් කම්පා නොවීමේ තාදී ගුණය හඳුන්වා, එයින් නූතන සමාජයට ගත හැකි ආදර්ශ ප්‍රකට කරන්න.**

අටලෝ දහම යනු ලාභ, අලාභ, අයස, යස , නින්දා, ප්‍රශංසා, සැප, දුක් යන අටයි. අටලෝ දහම හමුවේ බුදුරදුන් කම්පා නොවූහ. එසේ කම්පා නොවී කටයුතු කිරීම තාදී ගුණයයි.


**(ලකුණු 03යි)**

**නූතන සමාජය ට ගත හැකි ආදර්ශ**

- සැපතේදී උදම් නොවීමටත්
- දුකේදී කම්පා නොවීමටත්
- ලාභයේදී සතුටුවෙමින් ද අලාභයේදී දුක්වීමෙන් ද කටයුතු නොකිරීමටත්
- කීර්ති, ප්‍රශංසා ඉදිරියෙහි උද්දාම නොවීමටත්
- නින්දා, අපහාස, අපකීර්ති ඉදිරියේදී දුක් නොවී මැදහත්ව ක්‍රියා කිරීමත් උසස් පෞරුෂ ලක්ෂ ණයක් බවත් පෙන්වාදි තිබීම මෙහිලා අපේක්ෂිතයි.

**(ලකුණු 02යි)**
**ලකුණු (03+02=05යි)**
**(මුළු ලකුණු 10යි)**

### 3.5.2 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.5(a)

II පත්‍රයේ II කොටසට අයත් ප්‍රශ්නයක් වන මෙම ප්‍රශ්නය අංක 3.1 ප්‍රස්තාරය අනුව තෝරාගෙන ඇති ප්‍රතිශතය 91.25%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.
ඉන්

0 - 2 ප්‍රාන්තරයේ 29%ක් ද,
3 - 5 ප්‍රාන්තරයේ 45%ක් ද,
6 - 7 ප්‍රාන්තරයේ 16%ක් ද,
8 - 10 ප්‍රාන්තරයේ 10%ක් ද,

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 26%ක් වන අතර අපේක්ෂකයන් 74% ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.5(b)

බුද්ධ චරිතය ඇසුරෙන් මෙම ප්‍රශ්නයේ (i) කොටස සකස් කර ඇති අතර පහසුතාව 35%ක් තරම් සාපේක්ෂව ඉතා අඩු අගයකි. පෙළ පොතේ වැඩි අවධානයක් යොමු වන විෂය කොටසක් වුවත් නිවැරදිව විෂය කරුණු අවබෝධ කර නොගැනීම මෙම අඩු සාධනයට හේතුවක් ලෙස දැක්විය හැකිය.
බුද්ධ චරිතය ඇසුරෙන් ම සකස් කර ඇති (ii) කොටසේ පහසුතාව 52%කි. බුදු සිරිතට සම්බන්ධ සිද්ධි ගණනාවක් ඇසුරෙන්ම පිළිතුරු ගොඩනැගිය හැකි වීමත් හා එම සිද්ධි ප්‍රකට කරුණු වලින් පෝෂණය වී තිබීමත් මෙම ඉහළ පහසුතාවට හේතු ලෙස දැක්විය හැකිය.
බුදු සිරිතේ ඉතා ප්‍රකට ගුණයක්වන තාදී ගුණය ඇසුරෙන් (iii) කොටස සකස් කර ඇති අතර එහි පහසුතාව 59%කි. බුද්ධ චරිතයේ විවිධ අවස්ථාවන්හිදී විවරණය කරනු ලබන අටලෝදහම හා එහි සමාජ උපයෝගීතාව පිළිබඳ අවස්ථා වැඩි ගණනකදී අධ්‍යයනය කිරීමට ලැබීම හා නිරන්තරයෙන්ම විවිධ අවස්ථාවල සිසුන්ට ශ්‍රවණය කිරීමට හැකිවීම නිසාත් මෙම ප්‍රශ්නය සඳහා ඉහළ ශිෂ්‍ය සාධනයට හේතු වී තිබිය හැකිය.
සිසුන්ට වඩාත් පහසුවෙන් ග්‍රහණය කරගත හැකි පරිදි සරල අකාරයට ගුණාත්මකව පාඩම සංවර්ධනය කිරීමත්, විෂය කරුණු හොඳින් ග්‍රහණය කරවීමට කතා,සිද්ධි, අවස්ථා ඇසුරින් සමාජ උපයෝගීතාව සිදුවන අයුරු පැහැදිලි කිරීමත්, විචාරශීලී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සංවිධානය කිරීමත්, මගින් ශිෂ්‍ය සාධන මට්ටම තවදුරටත් ඉහළ නැංවීමට කටයුතු කළ හැකිය.

## 03 ප්‍රශ්නය

**(i) රජගහ නුවර වාර්ෂිකව පවත්වනු ලැබූ ගිරග්ගසමජ්ජ නම් සැණකෙළි උත්සවය නැරඹූ සාරි හා මොග්ගලී බැමිණියන්ගේ පුත්‍රයන් දෙපළ නම් කරන්න.**

උපතිස්ස හා කෝලිතයි.

**(ලකුණු 02යි)**

**(ii) අගසව් මුගලන් මහරහතන් වහන්සේ ශාසන චිරස්ථිතිය උදෙසා සිය වගකීම් මනා අවබෝධයෙන් හා කැපවීමෙන් ඉටු කළ බවට සාධක තුනක් ගෙනහැර දක්වන්න.**

- නොමග ගිය දේවදත්ත පාක්ෂික භික්ෂූන් සුමගට ගැනීම
- මච්ඡරිය කෝසිය සිටුතුමා මසුරුකමින් මුදවාලීම
- නන්දෝපනන්ද නාගරාජයා දමනය කිරීම
- මාරතජ්ජනීය සූත්‍රයෙහි සඳහන් මාරයා තම සිරුර තුළ පෙරළි කළ අවස්ථාවේ දෙව්ලොව තොරතුරු දක්වා ජනතාවට ධර්ම දේශනා කිරීම.
- බුදුරදුන් මාතෘ දිව්‍යරාජයාට අභිධර්මය දේශනා කිරීමට දෙව්ලොව වැඩම කළ අවස්ථාවේ දෙව්ලොව තොරතුරු විස්තර කොට ජනතාවට ධර්ම දේශනා කිරීම
- මිනිස් ලොව පමණක් නොව දෙව්ලොවද නිරයේද සැරිසරමින් සතියක් තුළ පින් පව් හා ඒවායේ විපාක ජනතාවට දේශනා කිරීම.

**මේ අතුරින් තුනක් සඳහා (ලකුණු 03යි)**

**(iii) මුගලන් මහරහතන් වහන්සේගේ තෙදවත් ගුණය ප්‍රකට වන අවස්ථා දෙකක් උන්වහන්සේගේ චරිතය ඇසුරින් කෙටියෙන් පහදන්න.**


- වරක් බුදුරදුන් පොහොය සීමාවේදී දුසිල් භික්ෂුවක් සිටීම නිසා පොහොය නොකොට සිටි අවස්ථාවේදී එවැනි කෙනෙකු සිටී නම් ඉවත් වන්නැයි කියාත් එම භික්ෂුව ඉවත් නොවූ බව දිවැසින් බලා මුගලන් තෙරුන් අදාළ භික්ෂුව වෙත ගොස් අතින් අල්ලා ඉවත් කිරීම.
- චාතුමා සූත්‍රයේ සඳහන් පරිදි වරක් නවක භික්ෂූන්ගේ කැකෝ ගැසීමක් නිසා සැරියුත් මුගලන් දෙනමත් උන්වහන්සේලාගේ දහසත් පිරිවරක් දෙව්රම් වෙහෙරින් නෙරපීමෙන් පසු අනේපිඬු සිටුතුමා ආදී දායකයන් හා දෙව්බඹුන් පවා මැදිහත් වී බුදුරදුන් කමා කරවාගෙන උන්වහන්සේලා ආපසු වැඩම කරවා ගන්නා ලදී. එම අවස්ථාවේ ඔබට සිතුනේ කුමක්දැයි සැරියුත් තෙරුන්ගෙන්ද මුගලන් තෙරුන්ගෙන්ද බුදුරදහු විමසා සිටියහ. එවිට මුගලන් තෙරණුවෝ තථාගතයන් වහන්සේත් සැරියුත් තෙරුන් වහන්සේත් සංඝයා පාලනය කිරීමෙන් ඇත් වන සේක් නම් තමන් වහන්සේවත් එය කළ යුතු යැයි සිතූ බව පැවසූහ. මේ අවස්ථාව
- මුගලන් තෙරණුවෝ ස්වකීය ඍද්ධිබලය ද යොදා ගනිමින් ධර්මය දේශනා කිරීම නිසා සැදැහැවත්හු බුදුරදුන් හා භික්ෂූන් වහන්සේ විෂයෙහි මහත් වූ පුද පූජා පැවැත්වූහ. එම නිසා අන්‍ය තීර්ථකයෝ මුගලන් තෙරුන් කෙරෙහි දැඩි වෛරයකින් පසු වූහ. උන්වහන්සේ ඝාතනය කිරීමට ද අපකරාධකරුවන් යෙදවූහ. පළමු හා දෙවැනි අවස්ථාවලදී සතුරන් වැටලූ කල්හි ඍද්ධි බලයෙන් එයින් ගැලවුණාහ.එහෙත් තෙවැනිවර සතුරන් වැටලූ කල්හි පෙර සසර මව්පියන් මැරීමේ පාපකර්මය නොවැළැක්විය හැකි සේ විපාකය කරා එළඹ ඇති බව දැන නිසලව සිටියහ. සතුරෝ කළා පෙළා උන්වහන්සේ මැරුණා යැයි සලකා පිටත් වූහ. ඍද්ධිබලයෙන් ශරීරය බලගන්වා බුදුරදුන් වෙත එළඹ උන්වහන්සේ නොයෙක් ප්‍රාතිහාර්ය පා වැඳ අවසර ගෙන කාලසිලාවට වැඩමවා එහිදී පිරිනිවන් පෑහ.

මේ අතුරින් කරුණු දෙකක් ඇසුරින් පිළිතුරු සකස් වී තිබූ පිළිතුරු සඳහා

**කරුණු 02 ක් දැක්වීමට ලකුණු 02 බැගින් 02 × 02 = 04**
**කෙටියෙන් පැහැදිලි කිරීමට ලකුණු 01**

**ලකුණු (04+01=05 යි.)**

### 3.5.3 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.6(a)

අංක 3.1 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 68.13%කි. ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන්,

0 - 2 ප්‍රාන්තරයේ 28%ක් ද,
3 - 5 ප්‍රාන්තරයේ 33%ක් ද,
6 - 7 ප්‍රාන්තරයේ 26%ක් ද,
8 - 10 ප්‍රාන්තරයේ 13%ක් ද,

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 39%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 61%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.6(b)

බුද්ධ කාලීන ශ්‍රාවක චරිත ඇසුරෙන් මෙම ප්‍රශ්නය සකස් කර ඇත. මෙම ප්‍රශ්නයේ i කොටසේ පහසුතාව 92%කි. ii කොටසේ පහසුතාව 56%කි. iii කොටසේ පහසුතාව ද 42%කි. ප්‍රශ්නයේ i කොටසින් අග්‍රශ්‍රාවකයන් වහන්සේලාගේ චරිත කතා පිළිබඳ විමසා ඇත. ප්‍රාථමික අධ්‍යාපනයේ සිට නිතර අසා ඇති විෂය කරුණක් මෙයින් විමසා තිබීම ඉහළ සාධනයට හේතු වී තිබිය හැකිය. වැඩි ලකුණු ප්‍රමාණයක් එනම් ලකුණු 5ක් ලබා ගත හැකි වුවත් iii කොටසේ පහසුතාව 42% කි. මුගලන් මහරහතන් වහන්සේගේ සෘද්ධි බලය පිළිබඳ නිසි අවධානයෙන් අවබෝධ කර නොගැනීම හා උදාහරණ අවස්ථා ඉදිරිපත් කළ නොහැකිවීම එම අඩු සාධනයට හේතුවිය හැකිය.
චරිත කතා, සිසුන්ට වඩාත් සිත්ගන්නා සුලු ලෙස ඉගැන්විය හැකි කොටසකි. එමෙන් ම පහසුවෙන් මතක තබා ගත හැකි අයුරින් ඉගැන්වීමට ගුරුවරුන් වගබලා ගත යුතුය. එසේම එම චරිත ඇසුරින් ශිෂ්‍යයන්ගේ ජීවිතයට ගත හැකි ආදර්ශ මතුකර දෙමින් ඒවා චරිතායනය කිරීමට මග පෙන්වීම වැදගත් වේ.

**04 ප්‍රශ්නය**

**(i) ආභිසමාචාරි ශික්ෂා සංග්‍රහ වී ඇති විනය පිටකාගත ග්‍රන්ථ දෙකක් නම් කරන්න.**

- මහාවග්ගපාළි, චුල්ලවග්ග පාළි, පරිවාර පාළි

මේ අතරින් දෙකකි.

**(ලකුණු 02යි)**

**(ii) 'මනුස්සවිග්ගහ පාරාජිකාපත්තිය ලියා, එහි අර්ථය ඉදිරිපත් කරන්න.**

යො පන භික්ඛු සඤ්චිච්ච මනුස්ස විග්ගහං ජීවිතා වොරොපෙය්‍ය සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍ය, මරණවණ්ණංවා සංවණ්ණෙය්‍ය, මරණයවා සමාදපෙය්‍ය, අම්භො පුරිස, කිං තුය්හිමිනා පාපකෙන දුජ්ජීවිතෙන මතන්තෙ ජීවිතා සෙය්‍යොති, ඉති චිත්තමනො චිත්ත සංකප්පො අනෙක පරියායෙන මරණවණ්ණංවා චිත්ත සංවණ්ණෙය්‍ය, මරණායවා සමාදපෙය්‍ය, අයම්ප පාරාජිකො හො අසංවාසො.

**(ලකුණු 02යි)**

අර්ථය :-
යම් කිසි භික්ෂුවක් (මොහු මරමියි) දැන දැන මනුෂ්‍ය ශරීරය ජීවිතයෙක් තොර කරයි නම් මරණය සඳහා ආයුධ හෝ පිළියෙල කොට තබයි නම්, මරණයෙහි අගය ප්‍රකාශ කරයි නම්, උත්සුක කරවයි නම්, එම්බා මිනිස, ඔබට මේ දුක්බර ජීවිතයෙන් කවර වැඩෙක් ද ඔබගේ ජීවත්වීමට වඩා මරණය උතුම් යැයි මරණ කැමති සිත් ඇතිව කල්පනා ඇතිව කල්පනා ඇතිව නොයෙක් අයුරින් මරණයෙහි ගුණ වනන්නේ ද මරණයෙහි හෝ උත්සුක කරන්නේ ද ඒ භික්ෂුතෙමේ පරාජ වූයේ වෙයි.(ප්‍රකෘති භික්ෂූන් සමඟ) සහවාසයට නොසුදුස්සෙක්ද වෙයි.

**(ලකුණු 01යි)**

**(ලකුණු 02 + 01 = 03යි)**

**(iii)** මනුස්සවිග්ගහ පාරාජිකාපත්තියට සම්පූර්ණ විය යුතු අංග පහ ගෙනහැර දක්වා, එම ශික්ෂා ප්‍රඥප්තිය පැනවීමෙහිලා බලපෑ නිදානය පෙන්වා දෙන්න.

සම්පූර්ණ විය යුතු අංග
- මනුෂ්‍ය ප්‍රාණියෙකු වීම
- මනුෂ්‍ය ප්‍රාණියෙකු බව දැනීම
- මරණ චේතනාව
- මරණය සඳහා උපක්‍රම යෙදීම
- එයින් මරණය සිදු කිරීම යනුයි.

**(ලකුණු 02යි)**

**නිදානය =**


භාග්‍යවතුන් වහන්සේ එක් කලෙක විශාලා මහනුවර ඇසුරු කොට මහාවනයෙහි කූටාගාර ශාලාවේ වැඩවාසය කළහ. කමටහන් ගැනීමට හෝ ධර්ම ශ්‍රවණයට පැමිණි භික්ෂූන් වහන්සේලාට අසන්නට ලැබුණේ ශරීරයේ පිළිකුල් බව පැවසෙන අශුභ භාවනාවේ අගයයි.

අඩමසක් පමණ කාය චිත්ත විවේකය කැමති බුදුරජාණන් වහන්සේ ඒ බව භික්ෂූන්ට පවසා පිණ්ඩපාතය රැගෙන එන භික්ෂුව හැර සෙසු භික්ෂූන්ගේ පැමිණීම නවතා විවේක සුවයෙන් කල් ගෙවූහ. භික්ෂූන් වහන්සේද අශුභ භාවනාවේ යෙදෙමින් කල් ගෙවූහ. පිළිකුල් භාවනාව කරද්දී ඇතැම් භික්ෂූන් වහන්සේලාට ශරීරයෙහි නිසරු බවත් එය දරා සිටීමෙහි නිෂ්ප්‍රයෝජන බවත් වැටහී බොහෝ දෙනෙකු දිවි තොර කර ගත්හ. ඇතැම්හු අන් ලවා සිය දිවි තොර කරවා ගත්හ. තවත් සමහරෙක් මිගලණ්ඩික නමැති පෙර මුව වැද්දෙකුව සිට පැවිදි වූ කෙනෙකු ලවා දිවි තාර කර ගත්හ. අඩ මස ගෙවී යන්නට බොහෝ භික්ෂූන් වහන්සේලා උපස්ථාන ශාලාවට රැස් කරවී. දිවි තොර කර ගැනීමේ ආදීනව පවසා මේ ශික්ෂාව පැනවූහ.

**(ලකුණු 03යි)**

**(ලකුණු 03 + 02 = 05 යි)**

### 3.5.4 4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.7(a)

අංක 3.1 ප්‍රස්තාරය අනුව 04 ප්‍රශ්නය පිළිතුරු ලිවීම සඳහා තෝරාගෙන ඇති පිරිස 35%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන්

0 - 2 ප්‍රාන්තරයේ 34%ක් ද,
3 - 5 ප්‍රාන්තරයේ 34%ක් ද,
6 - 7 ප්‍රාන්තරයේ 21%ක් ද,
8 - 10 ප්‍රාන්තරයේ 11%ක් ද,
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 32%ක් වන අතර අපේක්ෂකයන් 68%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.7(b)

භික්ෂු විනය කොටසින් මෙම ප්‍රශ්නය සකස් කර ඇත.. III කොටසේ පහසුතාව 49%කි. ප්‍රශ්නයේ 1 කොටසින් විනය ශික්ෂා සංග්‍රහවී ඇති මූලික ග්‍රන්ථ පිළිබඳ විමසා ඇත. අභිසමාචාරී ශික්ෂා යන පදය ග්‍රහණය කර ගැනීමේ අපහසු බව සාධනය අඩු වීමට හේතු වී තිබිය හැකිය.
සතර පාරාජිකාවන්ට අයත් තුන්වන පාරාජිකාපත්තිය II කොටසින් විමසා ඇත. විෂය නිර්දේශයේ සතර පාරාජිකා කොටස ගුරුභවතුන් අනිවාර්ය වශයෙන් ශිෂ්‍යයන්ට වණපොත් කරවීමට කටයුතු කරයි. එම දැනුම හා අවබෝධය 64%ක ඉහළ සාධනයට හේතු වී තිබිය හැකිය.
III කොටසින් විමසා ඇති නිදාන කතාව බොහෝවිට ශිෂ්‍යයන්ට අවබෝධ වී ඇතත්, මනුස්සවිග්ගහ පාරාජිකාපත්තියට සම්පූර්ණ විය යුතු අංග පහ පිළිබඳ නිසි අවබෝධයෙන් තොරවීම හා එය වණපොත් කර නොතිබීම අඩු පහසුතාවට හේතු වී ඇති බව සිතිය හැකිය.
භික්ෂූන් වහන්සේට තම පැවිදි දිවිය සකස් කර ගැනීමට භික්ෂු විනය ඉගෙනීම අත්‍යවශ්‍ය වේ. පෙළපොතේ අන්තර්ගත විනය කොටස් වඩාත් ප්‍රගුණ කරවීමෙන් මෙම විෂය කොටස් පිළිබඳ සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවිය හැකිය. එසේම යහපත් භික්ෂු දිවියකට එය මනා උපස්ථම්භනයක් විය හැකිය.

### III කොටස

**05 ප්‍රශ්නය**

**(i) 'මාවොච එරුසං කඤ්චි' යන ගාථාව සම්පූර්ණ කරන්න.**

මාවොච එරුසං කඤ්චි - වුත්තා පටිවදෙය්‍යුතං
දුක්ඛාහි සාරම්භ කථා - පටිදණ්ඩා ඵුසෙය්‍යුතං

**(ලකුණු 02යි)**

**(ii) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න.**

කිසිවෙකුට පරුෂ වචන නොකියන්න. මන්ද එසේ ඔබ පරුෂ වචන කී විට ඔවුන් ඔබටද පරුෂ වචන කියනු ඇත. එකට එක කියා ගැනීම දුකක්මය. ඔබ අනුන්ට පහර දීම් ආදිය කළොත් ඔබටද පහර කෑමට සිදු වන්නේය.

**නිවැරදි අර්ථයට සම්පූර්ණ ලකුණු ලැබේ. (ලකුණු 03යි)**

**(iii) පෙර කළ පාප කර්මයකින් අශෝභන විපාකයක් විඳි කුණ්ඩධාන තෙරුන්ගේ කථාව ලියා දක්වා, එයන් වර්තමාන සමාජයට ලබාදෙන පණිවුඩය සාකච්ඡා කරන්න.**

කුණ්ඩධාන තෙරුන් වහන්සේ පැවිදි උපසම්පදා වූ දින පටන් යන යන තැන පසු පසින් ගැහැණියක් ගමන් කරනු අන් අයට පෙනේ. ඒ බව උන්වහන්සේට නොපෙනේ. එයින් උන්වහන්සේ මිනිසුන්ගේ නොයෙක් උසුළු විසුළුකම්වලට ලක්වූහ.

පෙර කාශ්‍යප බුදුරදුන් දවස එක් මවකගේ දරුවන් දෙදෙනෙකු සේ සමගියෙන් විසූ භික්ෂූන් වහන්සේලා දෙනමකගේ විශ්වාසය බිඳ හෙළන්නට එක් දේවතාවියකගේ නොපනත්කම් හේතු විය.ඒ නොපනත්කම් කළ දේවතාවිය පසුව උන්වහන්සේලාගෙන් සමාව ගත්තදත් ගෞතම බුදුරදුන් දවස කුණ්ඩධාන තෙරුන් ලෙස උපත ලබා එහි විපාක වින්දේය.

මේ ඇසුරින් වර්තමාන කථාව හා අතීත කථාව දක්වා තිබිය යුතුය.

**(ලකුණු 03 යි)**


**සමාජයට සපයන ආදර්ශය -**

- කිසිවෙකුට පරුෂ වචන නොකියන්න. මන්ද පරුෂ වචන කී කල්හි ඔවුන්ද පෙරළා පරුෂ වචන කියන බැවිනි.
- කිසිවෙකුට පහර නොදෙන්න. මන්ද පෙරලා ඔවුන්ද පහර දෙන බැවිනි.එකට එක නොකරන්න.මන්ද එය දුක්කම වන බැවිනි.
- කළ වරදට විපාක අනුන්ට නොව තමාටම හිමි වන බැවින් වැරදි කිරීමෙන් වළකින්න.

මේ ඇසුරින් ආදර්ශ දක්වා තිබිය යුතුය.

**(ලකුණු 02 යි)**
**(ලකුණු 03 + 02= 05යි)**

### 3.5.5 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.8(a)

අංක 3.1 ප්‍රස්තාර අනුව 05 ප්‍රශ්නය පිළිතුරු ලිවීම සඳහා තෝරා ගෙන ඇති පිරිස 28.75%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන්

0 - 2 ප්‍රාන්තරයේ 41%ක් ද
3 - 5 ප්‍රාන්තරයේ 35%ක් ද
6 - 7 ප්‍රාන්තරයේ 11%ක් ද
8 - 10 ප්‍රාන්තරයේ 13%ක් ද

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 24%ක් වන අතර අපේක්ෂකයන් 76% ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන්ය.




ප්‍රස්තාරය 3.8(b)

මෙම ප්‍රශ්නය ධම්මපදය ඇසුරින් සකස් කර ඇත. මෙම ප්‍රශ්නයේ i කොටසේ පහසුතාව 63%කි. ii කොටසේ පහසුතාව 39%කි. iii කොටසේ පහසුතාව 41%කි.

මෙම ප්‍රශ්නයේ i කොටසින් පාලි ගාථාවක් විමසා ඇති අතර අදාළ ගාථාව වණ පොත් කර තිබීම එම කොටසේ ඉහළ ශිෂ්‍ය සාධනයට හේතු විය හැකි ය.

ii කොටසින් පාලි ගාථාවෙහි සිංහල අර්ථය විමසා ඇති අතර ඒ පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය අඩු වීම අඩු ශිෂ්‍ය සාධනයට හේතුවක් විය හැකි ය.

iii කොටසේ පහසුතාව ද අඩු අගයකි. ගාථාවට අදාළ නිදාන කතාව පිළිබඳ අපේක්ෂකයන් තුළ නිරවුල් මතකයක් නොතිබීම ද, දන්නා විෂය කරුණු වුවද ප්‍රශ්නයට ගැළපෙන අකාරයට ලේඛනගත කිරීමේ දුර්වලතාව ද මෙයට හේතු විය හැකි ය.

පාලි ගාථාවල නිරවුල් අර්ථ වඩාත් පැහැදිලි ලෙස ප්‍රකාශ කිරීම සඳහා සිසුන් හුරුකරවීමත්, අදාළ නිදාන කථා මෙන්ම එම කරුණු සමාජයට ගලපා ගන්නා ආකාරය සාකච්ඡා කරමින්, එම කරුණු නිවැරදිව හා නිරවුල්ව ලේඛනගත කිරීමේ අභ්‍යාසවල සිසුන් නිතර යෙදවීමත් මඟින් මේ සඳහා සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

**06 ප්‍රශ්නය**

**(i) 'ධර්ම සංගීති' යන්න බුදුරජාණන් වහන්සේ විසින්ම අනුමත කරන ලද්දක් බවට සාධන දෙකක් ත්‍රිපිටකාගත සූත්‍ර දේශනා අතරින් ඉදිරිපත් කරන්න.**

අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ සද්ධම්ම සම්මොස සූත්‍ර
දීඝනිකායේ පාසාදික සූත්‍රය
දීඝනිකායේ සංගීති සූත්‍රය
මේ අතරින් දෙකකි.

**(ලකුණු 02යි)**

**(ii) ධර්ම සංගීතියක් යනු කුමක් දැයි දක්වා, ප්‍රථම ධර්ම සංගිතියෙහිලා බලපෑ දුරස්ථ හේතු පෙන්වා දෙන්න.**

ධර්ම සංගීතියක් යනු සද්ධර්මය සජ්ඣායනා කිරීමයි. ධර්මධරයන් ධාරණය කර ගත් සද්ධර්මය සසඳා බලමින් සාකච්ඡා කිරීමෙන් සියලු දෙනාගෙන් සම්මත වූ ධර්මය සජ්ඣායනා කොට තහවුරු කිරීමෙන් සිදු කෙරේ. එය ධර්ම සංගයනාව යැයි කියනු ලැබේ.

**(ලකුණු 01යි**

දුරස්ථ හේතු
- විසිරී පැවැති ධර්මය හා විනය ඒකරාශී කිරීම හා එය ක්‍රමානුකූලව සකස් කිරීම.
- ධර්ම - විනය ශාස්තෘවරයා වශයෙන් සැලකිය යුතුය යන බුදුවදන සඵල කර ගැනීම.
- ධර්ම විනයට එරෙහිව නැගෙන අභ්‍යන්තර හා බාහිර බලවේග මැඩලීම.
- ශාසනයේ චිර පැවැත්ම සහතික කිරීම.
- අධර්මය හා අවිනය රජවීම වළක්වා ධර්මය හා විනය බැබළවීමට සැලැස්වීම.

**මේ කරුණු අතුරින් දෙකක්වත් ඇතුළත් වන සේ පිළිතුරු සකස් විය යුතුයි.**

**(ලකුණු 02යි)**
**(ලකුණු 01 + 03 = 03යි)**

**(iii) සද්ධර්මයේ ආරක්ෂාවට හා චිරස්ථිතියට අනුගමනය කළ වැඩපිළිවෙළ දක්වා ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵල සමාලෝචනය කරන්න.**

**සද්ධර්මය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යෑමට භාණක පරපුරක් සකස් කිරීම.එහිදී,**
- විනය පිටකය - උපාලි මහරහතන් වහන්සේ ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට
- දීඝ නිකාය - ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට
- මජ්ඣිම නිකාය - සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට
- සංයුත්ත නිකාය - මහා කාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට
- අංගුත්තර නිකාය - අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට


**(ලකුණු 03යි)**

ප්‍රතිඵල සමාලෝචනය -
- තැන තැන විසිරි තිබුණ බුද්ධ දේශිත ධර්ම - විනය එක්රැස් කොට ඒ පිළිබඳව තිබූ දුර්මත ඉවත් කොට නිර්මලත්වයට පත් කිරීම.
- ධර්මය හා විනය ඒ ඒ භික්ෂු පරම්පරාවලට පවරා මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යෑමට භාණක පරපුරට වගකීම පැවරීම.
- ධර්මය හා විනය ශාස්තෘත්වයෙහි තබා කටයුතු කිරීමට තීරණය කිරීම.
- අධර්මවාදීන් හා අවිනයවාදීන් මැඩ පැවැත්වීම.
- පනවන ලද ශික්ෂා ප්‍රඥප්ති ලිහිල් නොකිරීමටත් නොපනවන ලද ශික්ෂා ප්‍රඥප්ති නොපැනවීමටත් තීරණය කිරීම.
- ආනන්ද තෙරුන්ට එල්ල වූ චෝදනා විසඳා නිදහස් කිරීම.
- ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩනය පැනවීමට තීරණය කිරීම.
- අධර්මය හා අවිනය රජවීම වළක්වා ධර්මය හා විනය බැබළවීමට කටයුතු කිරීම.

**මේ අතරින් කරුණු 04 ක් වත් පදනම් කරගෙන පිළිතුරු ලියා තිබිය යුතුයි.**

**(ලකුණු 03යි)**
**(ලකුණු 02 + 03 = 05යි)**

### 3.5.6 6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.9(a)


අංක 3.1 ප්‍රස්තාරය අනුව 06 ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් පිරිස 57.5%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන්

0 - 2 ප්‍රාන්තරයේ 52%ක් ද,
3 - 5 ප්‍රාන්තරයේ 34%ක් ද,
6 - 7 ප්‍රාන්තරයේ 11%ක් ද,
8 - 10 ප්‍රාන්තරයේ 03%ක් ද,

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 14%ක් වන අතර අපේක්ෂකයන් 86%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක්




ප්‍රස්තාරය 3.9(b)

මෙම ප්‍රශ්නය ශාසන ඉතිහාසය ඇසුරින් විමසා ඇත. ප්‍රශ්නයේ 1 කොටසේ පහසුතාව 13%කි. II කොටසේ පහසුතා 50%කි. III කොටසේ පහසුතාව 46%කි. සංගායනා පිළිබඳව සිසුන් ඉගෙන ගන්නා අතර එහි මූලබීජය පිළිබඳව ත්‍රිපිටකාගත මූලාශ්‍රය 1 කොටසෙන් විමසා ඇති අතර එම මූලාශ්‍රය පිළිබඳ මතක තබා නොගැනීම අඩු ශිෂ්‍ය සාධනයට හේතු විය හැකිය. II කොටස සංගායනා පිළිබඳ නිර්වචනය හා පළමු වන සංගායනාවට බලපෑ දුරස්ථ හේතු විමසා ඇත. එය ශිෂ්‍යයන්ට ඉතා පහසු වූ විෂය කරුණක් වන බැවින් සාර්ථකව පිළිතුරුක් ලබා දී ඇති බව පැහැදිලි වේ. III කොටස පිළිතුර සඳහා විචාරාත්මකව කරුණු ඉදිරිපත් කළ යුත්තකි. සද්ධර්මය සුරක්ෂිත කිරීමට ගත් පියවර කොටසට ලකුණු 2ක් ද ප්‍රතිඵල කොටසට ලකුණු 3ක් ද ලබා දී ඇති බැවින් එක් එක් කොටසකට ප්‍රමාණවත් කරුණු පිළිතුරු ලෙස ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන් අපොහසත් වී තිබීම අඩු සාධනයට හේතු වී තිබිය හැකිය.

සංඛ්‍යාත්මකව කරුණු මතක තබා ගැනීමේ කෙටි ක්‍රම ශිෂ්‍යයන්ට ප්‍රගුණ කිරීමේ හා විචාරාත්මකව කරුණු ගලපා පිළිතුරු ලිවීමේ ක්‍රමවේද පැහැදිලි කිරීම හා අභ්‍යාසයන් හි යෙදවීමත් මගින් ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම කළ හැකිය.

## 07 ප්‍රශ්නය

**(i) රූප සමුද්දේස කොටස් දෙකක් දක්වන්න.**

- මහා භූත රූප 04 හා උපාදාය රූප 24 යන කොටස් දෙක
- නිෂ්පන්නරූප 18 හා අනිෂ්පන්න රූප 10 යන කොටස් දෙක හෝ දක්වා තිබිය යුතු වේ.

මෙයින් මහාභූතරූප හා උපාදායරූප හෝ නිෂ්පන්න රූප හා අනිෂ්පන්නරූප හෝ නිවැරදිව දක්වා තිබුණේ නම් **(ලකුණු 02යි)**

**(ii)** 'රූප' යන්න හඳුන්වා, විඤ්ඤාත්ති රූප දෙකක කෙටියෙන් පහදන්න.

රුප්පතීති හවෙ රූපං - විකාර පච්චයෙ සති

රූප රූපං තථා රූපං - පරියාපන්නතො පරං

ශීත, උෂ්ණ ආදී විරුද්ධ ප්‍රත්‍ය ඇති කල්හි යම් රූපයක් විකාරයට පැමිණේ ද එය රූපා රූප නම් වේ.වෙනත් රූපද රූප රූපයට ඇතුළත් වන බැවින් ඒවා රූප නම් වේ.

**(ලකුණු 01යි).**

කාය විඤ්ඤත්ති හා වචී විඤ්ඤත්ති යි.

කෙනෙක් අනුන්ට යම් අදහසක් දක්වන ආකාරය විඤ්ඤත්ති නම් වේ. ශරීරයේ අවයව ක්‍රියා කරවන චිත්ත කිරියා වායෝ ධාතුව ඒ ඒ ක්‍රියාව හැඟවීමට යෝග්‍ය වන පරිදි ඒ ඒ අතට හරවන බල විශේෂය කාය විඤ්ඤත්තියයි.

වචනයෙන් යමක් කථා කිරීමට අවශ්‍ය වූ විට වුවමනා අකුරු මෙන්ම වචන සැසඳෙන පරිදි උගුරෙන් එන වායෝ ධාතුව මෙහෙය වන බල විශේෂය වචී විඤ්ඤත්තියයි.

**(ලකුණු 02යි)**
**(01+02 =03යි)**

**(iii) ගබ්භසෙය්‍යක සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධියත් සමග පහළවන කර්මජ රූප කලාප දක්වා අල්පායුෂ්ක හා දීර්ඝායුෂ්ක වීමට බලපාන හේතු යුක්ති සාකච්ඡා කරන්න.**

අණ්ඩජ, ජලාබුජ යන දෙකොටස අයත් සත්වයන් මව් කුස හටගන්නා බැවින් ගබ්භසෙය්‍යක යැයි කියනු ලැබේ. සත්වයන්ට ප්‍රතිසන්ධියේදීම කාය දසක භාව දසක හා වත්ථු දසක යන රූප කලාප පහළ වෙයි. මේවා ප්‍රතිසන්ස්ධියත් සමඟ පහළ වන්නේ කර්මජ රූප කලාප වන බැවිනි.

කර්මජ රූප කලාප 09 කි.එනම්,

- චක්ඛු දසකය
- සොත දසකය
- ඝාණ දසකය
- ජිව්හා දසකය
- කාය දසකය
- ඉත්ථිභාව දසකය
- පුම්භාව දසකය
- වත්ථු දසකය
- ජීවිත දසකය


**(ලකුණු 02යි)**

අල්පායුෂ්ක හා දීර්ඝායුෂ්ක වීමට හේතු -

ගබ්භසෙය්‍යක සත්වයන්ගේ චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා දසක පහළ වන්නේ ප්‍රතිසන්ධියෙන් පසුව එන ප්‍රවෘත්ති කාලයන්හිය. එයින් අල්පායුෂ්ක සත්වයන් මවු කුස වෙසෙන්නේ මද කාලයකි.ඔවුන්ට චක්ඛු ආදී දසක ඉක්මණින් පහළ වන නිසාය. දීර්ඝායුෂ්ක සත්වයන් මව් කුස වැඩි කාලයක් වෙසෙන අතර ඉහතින් ඇති වූ චක්ඛු, සෝත, ඝෘණ, ජිව්හා යන දසක හතර පහළ වන්නේ කල්ගත වීමෙනි.මනුෂ්‍යයන්ට චක්ඛු, සෝත, ආදී දසක පහළ වන්නේ ප්‍රතිසන්ධියෙන් සති එකොළොසකට පමණ පසුව යැයි අට්ඨකථා මතය වේ.චක්ඛු ආදී දසක හතර කල්ගත වී පහළ වන බැවිනි.


**(ලකුණු 03යි)**
**(ලකුණු 02 + 03 = 05යි)**

### 3.5.7 7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.10(a)

අංක 3.1 ප්‍රස්තාරය අනුව 07 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 53.75% කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන්
0 - 2 ප්‍රාන්තරයේ 57%ක් ද
3 - 5 ප්‍රාන්තරයේ 35%ක් ද
6 - 7 ප්‍රාන්තරයේ 6%ක් ද
8 - 10 ප්‍රාන්තරයේ 2%ක් ද
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 8%ක් වන අතර අපේක්ෂකයන් 92%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.10(b)


මෙම ප්‍රශ්නය කොටස් තුනකින් යුක්ත ව්‍යුහගත ප්‍රශ්නයක්වන අතර එය අභිධර්මයේ රූප කාණ්ඩය කොටසේ දැනුම පරීක්ෂා කිරීමට සකස් කර ඇත. කොටස් තුනේම පහසුතාව 43%ට අඩු අගයකි. I කොටසේ පහසුතාව 31%ක් ද II කොටසෙහි පහසුතාව 43%ක් ද III කොටසේ පහසුතාව 21%ක් ද වේ. මෙම ප්‍රශ්නයේ I කොටසින් රූප සමුද්දේසයේ මූලික ප්‍රභේද දෙක පිළිබඳ විමසා ඇති අතර එම පිළිතුර සරල දහම් කරුණක් වුවද එම අභිධර්ම විෂය කොටස පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය නිරවුල් නොවීම සහ ප්‍රමාණවත් නොවීම සාපේක්ෂ ඉතා අඩු ශිෂ්‍ය සාධනයට හේතු විය හැකිය.

ඒ ප්‍රශ්නයේම II කොටසින් රූප යන්න නිර්වචන ඇසුරින් හැඳින්වීම හා රූප අතර ඇති විඤ්ඤත්ති රූප දෙක පිළිබඳ පැහැදිලි කිරීමත් අපේක්ෂා කර ඇත. මේ පිළිබඳ නිරවුල් හා පැහැදිලි අවබෝධයක් නැතිකම හා නිර්වචන සම්බන්ධ පාලි පාඨ පිළිබඳ අනවබෝධය නිසා මෙම කොටසේ ශිෂ්‍ය සාධනය අඩු වීමට එය හේතු වී තිබිය හැකිය.

ප්‍රශ්නයේ III කොටසේ කර්මය රූප හා කර්ම සංකල්පයේ එන අල්පායුෂ්ක හා දීර්ඝායුෂ්ක ප්‍රතිසන්ධි පිළිබඳව විමසා ඇත. මේ සංකල්ප නිතර පරිශීලනය නොවීමත් මතක තබා ගැනීමට අපහසුවීමත් නිරවුල් අවබෝධය අඩුබවත් ගැඹුරු සංකල්පවීමත් 21%ක අඩු පහසුතාවට හේතු වී ඇතැයි සිතිය හැකිය.

අභිධර්මය බුදු දහමේ ඉගැන්වෙන ඉතා ගැඹුරු සංකල්පයක් වන අතර අපේක්ෂකයන්ට ප්‍රියමනාප විෂයක් ද නොවේ. මේ නිසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරතවන්නන් මේ පිළිබඳ වඩාත් අවධානය යොමු කර එය ප්‍රියමනාප විෂයක් බවට පත් කිරීමත් සරල ලෙස හා අවබෝධ කර ගත හැකි ලෙස ඉගෙනුම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීමත් තුළින් අභිධර්ම කරුණු පිළිබඳ නිරවුල් පැහැදිලි අවබෝධයක් ගොඩ නංවාගැනීමට කටයුතු කිරීම වැදගත් වේ.

## 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය, ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු, සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




**ප්‍රස්තාරය 3.11**

ත්‍රිපිටක ධර්මය විෂයයෙහි II පත්‍රයේ 1 කොටසේ පළමුවැනි ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. සමස්ත විෂය නිර්දේශයම ආවරණය වන ආකාරයට මෙම ප්‍රශ්නය සැකසී ඇති අතර එය කෙටි ප්‍රශ්න 10ක් ලෙස ඉදිරිපත් කර ඇත. අනිවාර්ය ප්‍රශ්නයක් වූ මෙම ප්‍රශ්නයට 98%ක අපෙක්ෂකයන් පිරිසක් පිළිතුරු සපයා ඇත. මෙම සමස්ත ප්‍රශ්නයේ සාමාන්‍ය පහසුතාව 46%කි. සමස්ත විෂය නිර්දේශය හා ඊට අදාළ පෙළ පොත පිළිබඳව පූර්ණ අවබෝධයක් නොමැතිවීම හා ඇතැම් කොටස්වලට අදාළව අපේක්ෂකයන්ගේ විෂය සාධන මට්ටම දුර්වල මට්ටමක පැවතීම මෙම අඩු ශිෂ්‍ය සාධනයට හේතු විය හැකියැයි උපකල්පනය කළ හැකිය.

II පත්‍රයේ II හා III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් අපේක්ෂකයන් තෝරා ගත යුතු අතර ඒ සඳහා එක් එක් කොටසින් ප්‍රශ්න 3 බැගින් සපයා ඇත.

II කොටසේ ප්‍රශ්න අංක 02,03 හා 04 ප්‍රශ්න පිළිවෙලින් බුද්ධ චරිතය, චරිත කතා සහ විනය යන තේමාවන් ඇසුරින් ද III කොටසේ ප්‍රශ්න අංක 05, 06 හා 07 පිළිවෙලින් ධම්මපදය ධර්ම කරුණු සහ අභිධර්මය යන තේමාවන් ඇසුරින් ද සකස් කර ඇත.

II කොටසේ ප්‍රශ්න අංක 02 හා 03 අපේක්ෂයන් වැඩි ප්‍රතිශයක් පිළිතුරු ලිවීම සඳහා තෝරා ගෙන ඇති අතර ප්‍රශ්න අංක 04 තෝරාගෙන ඇත්තේ 35%ක් තරම් සාපේක්ෂ අඩු අපේක්ෂකයන් ප්‍රතිශතයකි. IIකොටසේ 02 හා 03 ප්‍රශ්න ඇසුරින් විමසා ඇති විෂය කරුණුවලට අදාළ බුද්ධ චරිතය හා චරිත කතා යන තේමාවන් අපේක්ෂකයන් නිතර පරිශීලනය කරන පහසුවෙන් මතක තබා ගැනීමට හැකි විෂය කරුණු වීම එම ප්‍රශ්න වැඩි අපේක්ෂකයන් ප්‍රතිශතයක් තෝරා ගැනීමට මෙන්ම එම ප්‍රශ්නවල සාපේක්ෂ ඉහළ සාධනයටද හේතු විය හැකිය.

II කොටසේ 4 ප්‍රශ්නය විනය තේමාවට අදාළ විනය කොටස් ඇසුරෙන් සැකසී ඇති අතර එම ප්‍රශ්නයට අපේක්ෂකයන්ගේ තෝරා ගැනීමේ ප්‍රතිශතයද, එම ප්‍රශ්නයට අදාළ පහසුතාවද සාපේක්ෂව අඩු අගයක් ගැනීම එම විෂය කොටස පිළිබඳ අපේක්ෂකයන්ගේ පැහැදිලි අවබෝධයක් නොමැති වීමත් පරිශීලනයේ මඳ බවත් හේතු වී ඇති බව සිතිය හැකිය.

II පත්‍රයේ III කොටසේ ප්‍රශ්න අංක 6 හා 7 සාපේක්ෂව වැඩි අපේක්ෂකයන් ප්‍රතිශතයක් තෝරා ගෙන ඇති අතර 5 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 29%ක් තරම් සාපේක්ෂව අඩු අපේක්ෂකයන් ප්‍රතිශතයකි. එම අගය II කොටසේ ප්‍රශ්න තෝරාගත් ප්‍රතිශතයන්ගේ අවම අගයයි. නමුත් 5 ප්‍රශ්නයේ පහසුතාව, වැඩි අපේක්ෂකයන් පිරිසක් තෝරාගෙන තිබූ 6 හා 7 ප්‍රශ්නවලට පහසුතාවන්ට වඩා සාපේක්ෂව ඉහළ අගයකි. එනම් 5 ප්‍රශ්නයේ පහසුතාව 48%ක් ද 6 ප්‍රශ්නයේ පහසුතාව 36% ක් ද 7 ප්‍රශ්නයේ පහසුතාව 32%ක් ද වේ.

III කොටසේ 5 වන ප්‍රශ්නය ධම්මපදය ඇසුරින් සකස් ඇති අතර එම තේමාවට අයත් පාලි ගාථාවක්, එහි අර්ථය සහා නිදාන කථාව ආදී එකිනෙකට සම්බන්ධ කරුණු රාශියක් මෙම ප්‍රශ්නයේ පිළිතුරු ලෙස අපේක්ෂා කර ඇත. එම සියලු කරුණු හොඳින් මතකයේ තිබෙන අපේක්ෂකයන් පමණක් මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබීමත් බොහෝ අපේක්ෂකයන් මෙම විෂය කොටස් පිළිබඳ නිවැරදි පිළිවෙලින් මතක තබා නොගැනීමත් මෙම ප්‍රශ්නය අඩුවෙන් තෝරා ගැනීමට හේතු වී ඇතැයි සිතිය හැකිය. විමසා ඇති පාලි ගථාව පිළිබඳ ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන්ට නිවැරදි අවබෝධයක් තිබීම එම ප්‍රශ්නයේ සාපේක්ෂ ඉහළ පහසුතාවට හේතු වී ඇතැයි උපකල්පනය කළ හැකිය.

6 හා 7 ප්‍රශ්න පිළිවෙලින් ධර්ම කරුණු හා අභිධර්මය යන තේමා ඇසුරින් සැකසී ඇත. 5 ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු නොදන්නා අපේක්ෂකයන් ඉතිරි ප්‍රශ්නය තෝරා ගෙන ඇති බව සිතිය හැකිය. මෙම ප්‍රශ්නයේ පහසුතාව 32%කි. එය II පත්‍රයේ ප්‍රශ්න අතුරින් අඩුම පහසුතාවක් ඇති ප්‍රශ්නයයි.

මෙම ප්‍රශ්නය මගින් අභිධර්මය විෂය තේමාවට අදාළ රූප කලාප පිළිබඳ විමසා ඇති අතර එම විෂය කරුණු ගැඹුරු හා සංකීර්ණ බැවින් ඒ පිළිබඳ නිරවුල් අවබෝධය අඩුවීමත් එම විෂය කරුණු නිතර නිතර පරිශීලනය නොවීමත් මතක ගැනීමට අපහසුවීමත් අපේක්ෂකයන්ගේ අඩු රුචිකත්වයත් මෙම ඉතා අඩු ශිෂ්‍ය සාධනයට හේතු විය හැකිය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ශිෂ්‍යයන්ට මතක තබා ගැනීමට අසීරු ශිෂ්‍ය රුචිකත්වය අඩු ගැඹුරු හා සංකීර්ණ විෂය කොටස් ඉගැන්වීමේ දී ශිෂ්‍යයා තුළ කැමැත්ත ඇති වන ලෙසට සරලව පැහැදිලිව, හා විවිධ ඉගෙනුම් සම්පත් හා ඉගෙනුම් ක්‍රම ශිල්ප උපයෝගි කරගනිමින් ශිෂ්‍ය රුචිකත්වය වැඩෙන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමට කටයුතු කිරීමෙන් මෙම විෂය කොටස් සම්බන්ධ ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකිය.

## 4 පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන්ගේ අවධානයට යොමු කළ යුතු කරුණු

- ප්‍රශ්න පත්‍රයේ සඳහන් මූලික උපදෙස් කියවා හොඳින් වටහා ගැනීමට උත්සාහය ගත යුතු ය.

- පිළිතුරු තෝරා ගැනීමේදී ඉතාම නිවැරදි පිළිතුරු තෝරා ගැනීමට උත්සාහ කළ යුතු ය.

- අනිවාර්ය ප්‍රශ්න හා තෝරාගත් ප්‍රශ්න වශයෙන් ද කොටස් හා අනුකොටස් වශයෙන් ද ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ලිවීමට ගත වන කාලය නිසි ලෙස කළමනාකරණය කිරීම පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. මේ සඳහා අතිරේක කියවීම් කාලය ඵලදායි ලෙස යොදා ගත යුතු ය.

- නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර සැපයීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීමද නොකළ යුතු ය.

- විෂය කරුණු සංවිධානාත්මකව ඉදිරිපත් කිරීමේ දුර්වලතා මග හරවා ගැනීමට කටයුතු කළ යුතු ය.

- සෑම පිටුවකම විභාග අංකය හා පිටු අංකය යෙදිය යුතු ය.

- I පත්‍රයට පිළිතුරු සැපයීමේදී පැන්සල භාවිතා නොකළ යුතු ය

- නිල් හෝ කලු පෑන් පමණක් භාවිතා කළ යුතු ය.

- මකන දියර භාවිතා කිරීමෙන් වැළකිය යුතු ය.

- නිවැරදි හා පැහැදිලි අත්අකුරු භාවිතය ලකුණු ලබා ගැනීමට පහසු මාර්ගයක් බව මතකයේ රඳවා ගත යුතු යි.

- II පත්‍රයට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

- පිළිතුරු පත්‍ර ඇමිණීමේදී පිටු අංක නිවැරදිව තබා තදින් ගැට ගැසිය යුතු ය.

## 5 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා

- විෂය කරුණු මතකයේ තබා ගැනීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී උචිත උපක්‍රම සහ ක්‍රමවේද භාවිතා කළ යුතු ය.

- විෂය කරුණුවලට අදාළ අතිරේක පොතපත හා ලිපිලේඛන කියවීම සඳහා සිසුන්ට පෙළඹවීම් ඇති කිරීම සහ පරිභාෂික වචන සහ නිවැරදි භාෂා ව්‍යවහාර සහිතව ලිවීමට හුරු කළ යුතු ය.

- පැවරුම් සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා සිසුන් උනන්දු කළ යුතු ය.

- නිවැරදි උච්චාරණය සහිතව වණපොත්කරණයට හුරු කළ යුතු ය.

- ප්‍රශ්නවලට අදාළ විෂය කරුණු සංවිධානාත්මකව විචාරාත්මකව හා විස්තරාත්මකව ලිවීම සඳහා හුරුව ඇති කළ යුතු ය.

- මූලාකෘති ප්‍රශ්න පත්‍ර, අනුමාන ප්‍රශ්න පත්‍ර, පසු ගිය ප්‍රශ්න පත්‍ර අභ්‍යාස කරවා ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවීම සම්බන්ධව සිසුන්ට ප්‍රායෝගික පුහුණුවක් ලබාදිය යුතු ය.

- ප්‍රශ්න පත්‍ර ව්‍යූහය සහ ලකුණු දීමේ ක්‍රමවේදය පිළිබඳ සිසුන් දැනුවත් කළ යුතු ය.

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලි සම්බන්ධ කිරීමේදී ඉගෙනුම් සම්පත් මනා ලෙස හා සැලසුම් සහගත ලෙස යොදා ගැනීම කළ යුතු ය.

- ත්‍රිපිටකය ඉගෙනීම ගිහි පැවිදි දෙපාර්ශවයේ ම වගකීමක් බව අවධාරණය කරවිය යුතු ය.

- ත්‍රිපිටකය ඉගෙනීම ශාසනික පැවැත්මට අත්‍යවශ්‍යම කරුණක් බව අවධාරණය කරවිය යුතුය.

Printed by
Department of Examinations Press